# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2373/32 - 2024 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා - 2024.02.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත**

4 (2) වගන්තිය යටතේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙතැන් සිට "ආයතනය" ලෙස හැඳින්වේ), වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා මෙහි ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී.ලං.වි.ප්‍ර අනෙකුත් සියළුම අස්තිත්ත්ව වල, 2025 ජනවාරි 01 හෝ ඉන්පසුව ආරම්භ වන කාලපරිච්ඡේද සඳහා වූ මුල්‍ය ප්‍රකාශන විගණනය සඳහා බලාත්මක වන පරිදි සම්මත කර ඇත. පූර්ව ව්‍යවහාරය සඳහා ද අවසර තිබේ.

පාලක සභාවේ නියෝගය අනුව,

**ආර්. එස්. අනෝමා ප්‍රියදර්ශනි,**
**ලේකම්.**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය,
අංක 30ඒ, මලලසේකර මාවත,
කොළඹ 07.
03 ජනවාරි, 2024.

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 220 (සංශෝධිත)

## මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා තත්ත්ව කළමනාකරණය

(2025 ජනවාරි 01 හෝ ඉන් පසු ආරම්භ වන කාල පරිච්ඡේද සඳහා අනෙකුත් සියළුම අස්තිත්ත්ව වල මූල්‍ය ප්‍රකාශන විගණන සඳහා බලාත්මක වේ.)

පටුන

පිටුව

### හැඳින්වීම

මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ විෂය පථය ........................................ 1
සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහ කාර්යයේ නියුතු කණ්ඩායම්වල කාර්යභාරය ............ 2-9
බලපැවැත්වෙන දිනය ........................................ 10
**අරමුණ** ........................................ 11
**නිර්වචන** ........................................ 12
**අවශ්‍යතාවයන්**
කළමනාකරණය සහ විගණනවල ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්ව වගකීම්.. 13-15
ස්වාධීනත්වයට සම්බන්ධ දේ ඇතුළුව අදාල ආචාර ධර්ම අවශ්‍යතාවයන් .................. 16-21
විගණන කාර්යභාරයන් භාර ගැනීම සහ සේවා දායක සම්බන්ධතා පවත්වා ගැනීම .................. 22-24
කාර්යයෙහි සම්පත් ........................................ 25-28
කාර්යයෙහි කාර්ය සාධනය ........................................ 29 -38
අධීක්ෂණය සහ ප්‍රතිකර්ම ........................................ 39
කළමනාකරණය සහ ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා සමස්ත වගකීම භාර ගැනීම..... 40
ලේඛනගත කිරීම ........................................ 41
**ව්‍යවහාරකරණය සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු**
මෙම ශ්‍රීලංවිප්‍ර යේ විෂය පථය ........................................ අ1
සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහ කාර්යයේ නියුතු කණ්ඩායම්වල කාර්යභාරය ......... අ2-අ14
නිර්වචන ........................................ අ15-අ27
කළමනාකරණය සහ විගණනවල ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්ව වගකීම් අ28-අ37
ස්වාධීනත්වයට අදාළ දේ ඇතුළුව අදාල ආචාර ධර්ම අවශ්‍යතාවයන් ..................අ38-අ48
විගණන කාර්යභාරයන් භාර ගැනීම සහ සේවා දායක සම්බන්ධතා පවත්වා ගැනීම අ49-අ58
කාර්යයේ සම්පත් ........................................ අ59-අ79
කාර්යයෙහි කාර්ය සාධනය ........................................ අ80-අ108
අධීක්ෂණය සහ ප්‍රතිකර්ම ........................................අ109-අ112
කළමනාකරණය සහ ගුණාත්මකභාවය සාක්ෂාත් කරගැනීම සඳහා සමස්ත වගකීම භාර ගැනීම....අ113-අ116
ලේඛනගත කිරීම ........................................ අ117-අ120

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 220 (සංශෝධිත), මූල්‍ය ප්‍රකාශන විගණනයක් සඳහා තත්ත්ව කළමනාකරණය කියවිය යුත්තේ ශ්‍රීලංවිප්‍ර (200), ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනයක් මෙහෙයවීම සමග එකට සම්බන්ධ කරගනිමිනි.

## හැඳින්වීම

### මෙම ශ්‍රීලංවිප්‍රයේ විෂය පථය

1. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (ශ්‍රීලංවිප්‍ර), මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ කාර්යයෙහි නියැලීමේ මට්ටමෙන් සහ කාර්යයෙහි නියුක්ත හවුල්කරු හා සම්බන්ධිත වගකීම් පිළිබඳව ආමන්ත්‍රණය කරයි. මෙම ශ්‍රීලංවිප්‍ර කියවිය යුත්තේ අදාළ ආචාරධර්ම අවශ්‍යතාවයන් සමග එක්වය. (යොමුව: අ1-අ38 ඡේද)

### සමාගමේ තත්ත්ව කළමණාකරණ පද්ධතිය සහ කාර්යයෙහි නියුතු කණ්ඩායම්වල කාර්යභාරය

2. ශ්‍රීලංතකප යටතේ සමාගමේ අරමුණු ලෙස මූල්‍ය ප්‍රකාශන විගණන හෝ සමාලෝචන සඳහා හෝ සමාගම විසින් සිදුකරනු ලබන වෙනත් සහතික කිරීම් සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතියක් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සමාගමට පහත පරිදි සාධාරණ සහතික වීමක් ලබා දෙයි. (යොමුව: අ13-අ14)

   (අ) සමාගම සහ එහි කාර්ය මණ්ඩලය වෘත්තීය ප්‍රමිතීන්ට සහ අදාල නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව තම වගකීම් ඉටුකරන අතර, එවැනි ප්‍රමිතීන්ට සහ අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියා කිරීම; සහ

   (ආ) සමාගම හෝ කාර්යයේ නියුක්ත හවුල්කරුවන් විසින් නිකුත් කරන ලද කාර්යය වාර්තා අවස්ථාවන්ට උචිත වීම.[1]

3. මෙම ශ්‍රීලංවිප්‍ර පාදක වනුයේ, සමාගම ශ්‍රීලංතකප හෝ අවම වශයෙන් ඉල්ලා සිටින ජාතික අවශ්‍යතාවලට යටත්වය යන පදනම මතය (යොමුව: අ2-අ3):

4. කාර්යයේ නියුක්ත හවුල්කරු විසින් මෙහෙයවනු ලබන කාර්යයෙහි නියුතු කණ්ඩායම, සමාගමේ තත්ත්ව කළමනාකරන පද්ධතියේ සංදර්භය තුළ මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවලට අනුකූලවමින් පහත පරිදි වගකිව යුතුය. (යොමුව: අ4-අ11 ඡේද)

   (අ) සමාගම විසින් සන්නිවේදනය කරන ලද හෝ ලබාගත් තොරතුරු භාවිතා කරමින් විගණන කාර්යයෙහි අදාළ තත්ත්ව අවදානම් (එනම්, සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වෙත) සමාගමේ ප්‍රතිචාර ක්‍රියාත්මක කිරීම;

   (ආ) විගණන කටයුතුවල ස්වභාවය සහ අවස්ථාවන් අනුව සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වලින් ඔබ්බට කාර්යයෙහි නියැලීමේ මට්ටමින් ප්‍රතිචාර සැලසුම්කර ක්‍රියාත්මක කරන්නේද යන්න; සහ

   (ඇ) විගණන කාර්යය මගින් සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි මගින් අවශ්‍ය වන ස්ථිර තොරතුරු සන්නිවේදනය කිරීම.

5. අනෙකුත් ශ්‍රීලංවිප්‍රයන්හි අවශ්‍යතාවලට අනුකූලවීමෙන් කාර්යයෙහි නියැලීමේ මට්ටමේදී තත්ත්ව කළමනාකරණයට අදාළ තොරතුරු ලබාගත හැකිය. (යොමුව: අ12 ඡේදය)

[1] ශ්‍රීලංතකප 1. 14 ඡේදය

6. එක් එක් කාර්ය භාරය සඳහා මෙම ප්‍රමිතිය සහ අනෙකුත් ශ්‍රීලංවිප්‍ර හි අරමුණු සාක්ෂාත් කර ගැනීම තුලින් ගුණාත්මක විගණන කටයුතුවල ස්ථාවර කාර්ය සාධනය මගින් මහජන යහපත ඉටුවේ. ගුණාත්මක විගණන කාර්යභාරයක් සාක්ෂාත් කර ගනු ලබන්නේ කාර්යභාරය සැලසුම් කිරීම සහ සිදුකිරීම සහ වෘත්තිය ප්‍රමිති වලට අනුකූලව සහ අදාල නෛතික සහ නියාමන අවශ්‍යතා අනුව එය වාර්තා කිරීමෙනි. එම ප්‍රමිති වල අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ අදාල නීතියේ හෝ රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල වීම, වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීම සහ වෘත්තිය සංශය දෘෂ්ටියකින් යුතුව ක්‍රියාත්මක කිරීමෙහි ඇතුළත් වේ.

7. ශ්‍රීලංවිප්‍ර 200,[2] ට අනුකූලව, කාර්යභාරයේ නියුතු කණ්ඩායමට වෘත්තීය සංශය දෘෂ්ටියෙන් යුක්තව විගණනයක් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට සහ වෘත්තිය විනිශ්චයකින් යුතුව කටයුතු කිරීමට සිදුවේ. විගණන කාර්ය භාරයේ ස්වභාවය සහ තත්ත්වයන් අනුව කළමනාකරණය සහ ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීමට යෝග්‍ය දැනුවත් තීරණ ගැනීමේ දී විනිශ්චය ක්‍රියාත්මක වේ. වෘත්තීය සංශය දෘෂ්ටිය කාර්යභාරයේ නියුතු කණ්ඩායම විසින් කරන ලද විනිශ්චයන්හි ගුණාත්මකභාවයට සහාය දක්වන අතර, මෙම විනිශ්චයන් හරහා කාර්යභාරයේ නියැළීමේ මට්ටමෙන් ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීමේ දී කාර්යයේ නියුතු කණ්ඩායමේ සමස්ත කාර්යක්ෂමතාවයට සහාය වේ. වෘත්තීය සංශය දෘෂ්ටියේ යෝග්‍ය අභ්‍යාසය කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ ක්‍රියා සහ සන්නිවේදනයන් තුළින් ප්‍රදර්ශනය කළ හැකිය. එවැනි ක්‍රියා සහ සන්නිවේදනයන්ට අවිඥානික පක්ෂග්‍රාහීත්වය හෝ සම්පත් සීමා වැනි වෘත්තීය සංශය දෘෂ්ටියේ උචිත ව්‍යායාමයට හානි විය හැකි බාධා අවම කිරීමට අවශ්‍ය නිශ්චිත පියවර ඇතුළත් විය හැකිය. (යොමුව: අ33-අ36 ඡේද)

*පරිමාණය*

8. මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා එක් එක් විගණනයේ ස්වභාවය සහ තත්ත්වයන් සම්බන්ධයෙන් අදාළ කරගත යුතු ලෙසට අදහස් කෙරේ. උදාහරණ:

(අ) කාර්යයෙහි නියුතු හවුල්කරු විසින්ම අඩු සංකීර්ණත්වයකින් යුතු අස්තිත්ත්වයක සම්පූර්ණ විගණනය සිදුකරන විට මෙම ශ්‍රීලංවිප්‍ර හි සමහර අවශ්‍යතා ව්‍යවහාර නොවේ, මක්නිසාදයත්, කාර්යයේ නියුක්ත කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන්ගේ සහභාගිත්වය මත වන කොන්දේසි අනුව බැවිනි.

(ආ) කාර්යයෙහි නියුතු හවුල්කරු විසින් සම්පූර්ණයෙන්ම විගණනයක් සිදු නොකළ විට හෝ ස්වභාවය සහ තත්වයන් වඩාත් සංකීර්ණ වූ ආයතනයක විගණනයකදී, කාර්යයෙහි නියුතු හවුල්කරු විසින් සමහර ක්‍රියා පටිපාටි, කාර්යයන් හෝ ක්‍රියාවන්හි සැලසුම් හෝ කාර්ය සාධනය කාර්යයෙහි නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට පැවරිය හැකිය.

කාර්යයේ නියුක්ත හවුල්කරුගේ වගකීම්

9. කාර්යයේ නියුක්ත හවුල්කරු අවසානයේ වගකීම දරන බැවින් මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා වලට අනුකූල වීම සඳහා වගකිව යුතුය. "කාර්යයෙහි නියුක්තයි හවුල්කරු වගකීම බාරගනියි" යන යෙදුම, කාර්යයේ නියුක්ත කණ්ඩායමේ දක්ෂ හෝ සුදුසු පළපුරුදු සාමාජිකයින්ට යෝග්‍ය පරිදි ක්‍රියාපටිපාටි, කාර්යයන් හෝ ක්‍රියාවන් සැලසුම් කිරීම හෝ කාර්ය සාධනය පැවරීමට කාර්යයේ නියුතු හවුල්කරුට අවසර දී ඇති අවශ්‍යතා සඳහා භාවිතාවේ. වෙනත් අවශ්‍යතාවයන් සඳහා මෙම ශ්‍රීලංවිප්‍රයෙන් පැහැදිලිවම අදහස් කරන්නේ අවශ්‍යතාවය හෝ වගකීම කාර්යයේ නියුක්ත හවුල්කරු විසින් ඉටු කළ යුතු බවත්, කාර්යයේ නියුක්ත හවුල්කරුට සමාගමෙන් හෝ කාර්යයේ නියුක්ත කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ගෙන් තොරතුරු ලබාගත හැකි බවත්ය. (යොමුව: අ22-අ25 ඡේද)

## බලාත්මක දිනය

10. මෙම ශ්‍රීලංවිප්‍ර 2023 දෙසැම්බර් 15 හෝ ඉන්පසුව ආරම්භ වන කාල පරිච්ෙද සඳහා මහජන ලබැඳියාවක් දක්වන අස්තිත්ත්වවල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා බලාත්මක වන අතර, 2025 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන කාල පරිච්ඡේද සඳහා අනෙකුත් සියළුම අස්තිත්ත්වල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා බලාත්මක වේ.

[2] ශ්‍රීලංවිප්‍ර 200; ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයන් පැවැත්වීම, 15-16 සහ අ20-අ24 ඡේද.

**අරමුණ**

11. විගණකගේ අරමුණ, ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම කාර්යය භාර ගැනීමේ මට්ටමේ පටන් සාක්ෂාත් කර ඇති බවට විගණක පහත දෑ පිළිබඳව සාධාරණ තහවුරුවක් සැලසීමය:

(අ) විගණක සිය වගකීම් ඉටු කර ඇති අතර, වෘත්තීය ප්‍රමිතීන් සහ අදාල නෛතික සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව විගණනය සිදුකර තිබීම; සහ

(ආ) විගණකගේ වාර්තාව අවස්ථාවට උචිත ලෙස නිකුත් කර තිබීම.

**නිර්වචන**

12. ශ්‍රීලංවිප්‍ර කාර්යය සඳහා පහත සඳහන් යෙදුම්වලට ආරෝපිත තේරුම් පහත දැක්වේ:

(අ) කාර්යයේ නියුක්ත හවුල්කරු[3] – කාර්යයේ නියුක්ත වීම සහ එය ඉටුකිරීමට වගකීම දරන සමාගම වෙනුවෙන් නිකුත් කරන වාර්තාව ගැන වගකිවයුතු සමාගම විසින් පත්කරන ලද හවුල්කරුවෙකු හෝ වෙනත් පුද්ගලයෙකු වන අතර, අවශ්‍ය වූ විට වෘත්තීය, නීතිමය හෝ නියාමන ආයතනයකින් සුදුසු අධිකාරියක් ඇති අය වේ.

(ආ) කාර්යයේ නිරතවීම් තත්ත්ව සමාලෝචනය කිරීම - කාර්යය පිළිබඳ වාර්තාවේ දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද කාර්යයේ නියුක්ත කණ්ඩායම විසින් සිදුකරන ලද සැළකියයුතු විනිශ්චයන් සහ ඒ මත එළැඹි නිගමන පිළිබඳව විෂය මූලික ඇගයීමක් සිදුකිරීමට කාර්යභාරයේ තත්ත්ව සමාලෝචක විසින් සිදුකර ඇති ක්‍රියාවලිය වේ.

(ඇ) කාර්ය භාරයේ තත්ත්ව සමාලෝචක - කාර්යයේ තත්ත්ව සමාලෝචනය සිදු කිරීමට සමාගම විසින් පත් කරන ලද හවුල් කරුවෙකු, සමාගමෙහි වෙනත් පුද්ගලයෙකු හෝ බාහිර අයෙකු හෝ වේ.

(ඈ) කාර්යයේ නියුතු කණ්ඩායම - විගණකගේ බාහිර විශේෂඥයින්[4] සහ කාර්යයට ඍජු සහායක් සපයන අභ්‍යන්තර විගණකවරුන් හැර විගණන කටයුතු සිදු කරනු ලබන සියළුම හවුල්කරුවන් සහ කාර්ය මණ්ඩලය සහ කාර්යයේ විගණන ක්‍රියාපටිපාටි සිදු කරන වෙනත් ඕනෑම පුද්ගලයින්[5] වේ. (යොමුව: අ15 - අ25 ඡේද)

(ඉ) සමාගම - පරිචයේ යෙදී සිටින පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාවක් හෝ වෙනත් වෘත්තීය ගණකාධිකාරි අස්තිත්ත්වයක් හෝ රාජ්‍ය අංශයෙහි සමාන ආයතනයක් වේ. (යොමුව: අ26 ඡේදය)

(ඊ) ජාල සමාගම - සමාගමේ ජාලයට අයත් සමාගමක් හෝ අස්තිත්ත්වයක් (යොමුව: අ27 ඡේදය)

(උ) ජාලය - විශාල ව්‍යුහයකි. (යොමුව : අ27 ඡේදය) එය:

(i) සහයෝගය ඉලක්ක කරගත්; සහ

(ii) පැහැදිලිවම ඉලක්කය, ලාභය හෝ පිරිවැය බෙදා ගැනීම හෝ කොටස් පොදුවේ අයත් කර ගැනීම, පාලනය හෝ කළමනාකරණය, පොදු තත්ත්ව කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, පොදු ව්‍යාපාරික උපක්‍රම, පොදු සන්නම් නාමයේ භාවිතය හෝ වෘත්තීමය සම්පත්වල සැළකිය යුතු කොටසකි

---

3 කාර්යයේ නියුක්ත හවුල්කරු, "හවුල්කරු" සහා "සමාගම" යන්න ඒවායේ අදාල රාජ්‍ය අංශ සමාන දෑ වලට යොමු කරමින් කියවිය යුතුය.

4 ශ්‍රීලංවිප්‍ර 620 - "විගණකගේ විශේෂඥ වැඩ භාවිතයට ගැනීම" 6(අ) ඡේද "විගණකගේ විශේෂඥ" යන යෙදුම නිර්වචනය කරයි.

5 ශ්‍රීලංවිප්‍ර 610 (2013 සංශෝධිත), අභ්‍යන්තර විගණක වරුන්ගේ වැඩ භාවිතා කරමින්, ඍජු ආධාර භාවිතය පිළිබඳ සීමාවන් ස්ථාපිත කරයි. බාහිර විගණකවරයාට අභ්‍යන්තර විගණකවරුන්ගෙන් ඍජු සහාය ලබා ගැනීම නීතියෙන් හෝ රෙගුලාසියෙන් තහනම් කළ හැකි බවද එය පිළිගනියි. එබැවින් ඍජු ආධාර භාවිතා කිරීමට අවසර දී ඇති අවස්ථාවන්ට සීමා වේ.

(ඌ) හවුල්කරු - වෘත්තීමය සේවා කාර්යය භාරයක් ඉටු කිරීම සම්බන්ධව සමාගම බැඳීමකට ලක් කිරීමට අධිකාරිය ඇති ඕනෑම පුද්ගලයෙකි.

(එ) පිරිස - හවුල්කරුවන් සහ සමාගමේ කාර්ය මණ්ඩලය.

(ඒ) වෘත්තීමය ප්‍රමිත - ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රීලංවිප්‍ර) සහ අදාල ආචාර ධර්ම අවශ්‍යතාවයන්.

(ඔ) අදාල ආචාර ධර්ම අවශ්‍යතාවයන් - විගණන කාර්ය භාරයක් සිදු කිරීමේදී වෘත්තීය ගණකාධිකාරිවරුන්ට අදාල වන වෘත්තීය ආචාර ධර්ම සහ ආචාරධර්ම අවශ්‍යතා පිළිබඳ මූලධර්ම වේ. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මුල්‍ය ප්‍රකාශ විගණනයට සම්බන්ධ වෘත්තීමය ගණකාධිකාරිවරුන් සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයෙහි (ශ්‍රී ලංකා නිදහස් ප්‍රමිත ඇතුළුව) (CA ශ්‍රී ලංකා කේතය) විධි විධාන සහ වඩාත් සීමාකාරි ජාතික අවශ්‍යතාවයන් ද සහිතව සමන්විත වේ.

(ඕ) ප්‍රතිචාරය (තත්ත්ව කළමනාකරණ පද්ධතියකට අදාලව) - තත්ත්ව අවදානම්(මක්) එකක් හෝ කීපයක් විසඳීම සඳහා සමාගම විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද පහත දැක්වෙන ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිඃ

(i) ප්‍රතිපත්ති යනු ගොඩාක්මක අවධානමකට (ම්) ආමන්ත්‍රණය කිරීම සඳහා කළයුතු හෝ නොකළයුතු දේ පිළිබඳ ප්‍රකාශ වේ. එවැනි ප්‍රකාශන ලේඛනගත කිරීම, සන්නිවේදනයන්හි පැහැදිලිව ප්‍රකාශ කිරීම හෝ ක්‍රියා සහ තීරණ හරහා හැඟවුම් කළ හැකිය.

(ii) ක්‍රියාපටිපාටි යනු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවේ.

(ක) සේවක මණ්ඩලය - හවුල්කරුවන් හැර සමාගම විසින් සේවයේ යොදවා ඇති යම් විශේෂඥයින් ඇතුළු වෘත්තිකයින් වේ.

**අවශ්‍යතාවයන්**

**විගණන වල ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්ව වගකීම්ඃ**

13. සමාගමේ සංස්කෘතිය සහ කාර්ය භාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයන්ගේ අපේක්ෂිත හැසිරීම අවධාරණය කරන කාර්යය සඳහා පරිසරයක් නිර්මාණය කිරීමේ වගකීම භාර ගැනීම ඇතුළුව විගණන කාර්ය භාරයේ ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යභාරයේ නියුතු හවුල්කරු සමස්ත වගකීම භාරගනී. එසේ කිරීමේදී, කාර්යභාරයේ නියුතු හවුල්කරු සිදුකරන ලද සැළකිය යුතු විනිශ්චයන් සහ එළැඹ ඇති නිගමන, කාර්යයේ ස්වභාවය සහ තත්ත්වයන් අනුව යෝග්‍ය ද යන්න තීරණය කිරීමට කාර්යභාරයේ නියුතු හවුල්කරුට ඇති පදනම මත කාර්යභාරයේ නියුතු හවුල්කරු විගණන කාර්යය භාරය පුරාවටම ප්‍රමාණවත් ලෙස සහ සුදුසු ලෙස සම්බන්ධ විය යුතුය (යොමුවඃ අ28 - අ37)

14. 13 ඡේදයේ විස්තර කර ඇති පරිසරය නිර්මාණය කිරීමේදී කාර්යභාරයේ නියුතු හවුල්කරු ගුණාත්මකභාවය සඳහා සමාගමේ කැපවීම පිළිබිඹු කරන සහ කාර්ය භාරයේ නියුතු කණ්ඩායම් සාමාජිකයින්ගේ අපේක්ෂිත හැසිරීම ස්ථාපිත කිරීම සහ සන්නිවේදනය කිරීම අවධාරණය කිරීමට පහත කරුණු ඇතුළුව පැහැදිලි ස්ථාවර සහ ඵලදායී ක්‍රියාමාර්ග සඳහා වූ වගකීම බාරගත යුතුය. (යොමුවඃ අ30 - අ34)

(අ) කාර්යය මට්ටමේදි කළමනාකරණයට සහ ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීමට දායක වීම සඳහා කාර්ය මණ්ඩලයේ නියුතු කණ්ඩායමේ සියලුම සාමාජිකයින් වගකිව යුතුය;

(ආ) කාර්ය භාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ට අදාළ වෘත්තීය ආචාර ධර්ම, වටිනාකම් සහ ආකල්පවල වැදගත්කම;

(ඇ) කාර්ය භාරයේ නියුතු කණ්ඩායම් අතර විවෘත හා ශක්තිමත් සන්නිවේදනයේ වැදගත්කම සහ පළිගැනීම් හා සම්බන්ධ බියෙන් තොරව ක්‍රියා කිරීමට කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ හැකියාව; සහ

(ඈ) විගණන කාර්යය පුරාවටම වෘත්තීය සංශය දෘෂ්ඨියෙන් යුතුව ක්‍රියාත්මක වන කාර්ය භාරයේ නියුතු කණ්ඩායමේ සෑම සාමාජිකයකුගේම වැදගත්කම.

15. මෙම ශ්‍රීලංවිප්‍රහි අවශ්‍යතාවයන්ට අනුකූලව ක්‍රියා කිරීමට කාර්යභාරයේ නියුතු හවුල්කරුට සහායවීමට මෙම ශ්‍රීලංවිප්‍රහි අවශ්‍යතාවයන්ට අදාල ක්‍රියාපටිපාටි, කාර්යයන් හෝ ක්‍රියාවන් සැලසුම් කිරීම හෝ කාර්ය සාධනය,

කාර්යභාරයේ නියුතු හවුල්කරු විසින් කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට පවරන්නේ නම්, කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ගේ මග පෙන්වීම සහ අධීක්ෂණය හා ඔවුන්ගේ කාර්යයන් සමාලෝචනය කිරීම තුළින් විගණන කටයුතු කළමනාකරණය කිරීම සහ එහි ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යභාරයේ නියුතු හවුල්කරු අඛණ්ඩව සම්පූර්ණ වගකීම භාරගත යුතුය. (යොමුවඃ අ37 හි 9 වන ඡේදය)

## ස්වාධීනත්වයට සම්බන්ධ දේ ඇතුළුව ව්‍යවහාර වන ආචාර ධර්ම අවශ්‍යතා

16. කාර්යභාරයේ නියුතු හවුල්කරුට විගණන කටයුතුවල ස්වභාවය සහ තත්ත්වයන් අනුව ව්‍යවහාර වන ස්වාධීනත්වයට අදාළ ආචාර ධර්ම අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. (යොමුවඃ අ38- අ42, අ48 ඡේද)

17. විගණන කටයුතු වල ස්වභාවය සහ තත්ත්වයන් අනුව ව්‍යවහාර වන අදාල ආචාර ධර්ම අවශ්‍යතා පිළිබඳව සහ පහත සඳහන් ඒවා ද ඇතුළුව සමාගමට අදාළ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි පිළිබඳව කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් දැනුවත් කර තිබීම පිළිබඳ වගකීම කාර්යයේ නියුතු හවුල්කරු විසින් භාර ගනී. (යොමුවඃ අ23-අ25, අ40- අ44 ඡේද)

    (අ) ස්වාධීනත්වයට සම්බන්ධ ඒවා ඇතුළුව ව්‍යවහාර වන ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූල වීමේ තර්ජන හඳුනා ගැනීම, ඇගයීම සහ ආමන්ත්‍රණය කිරීම;

    (ආ) ස්වාධීනත්වය හා සම්බන්ධ ඒවා ඇතුළුව ව්‍යවහාර වන ආචාර ධර්ම අවශ්‍යතා උල්ලංඝනය කිරීමට හේතු විය හැකි තත්ත්වයන් සහ එබඳු උල්ලංඝනය කිරීම් පිළිබඳව කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් දැනුවත් වූ විට ඔවුන්ගේ වගකීම්; සහ

    (ඇ) අස්තිත්ත්තවය විසින් නීති සහ රෙගුලාසි වලට අනුකූල නොවන අවස්ථාවක් පිළිබඳව කාර්යභාරයේ නියුතු සාමාජිකයින් විසින් දැනුවත් වූ විට ඔවුන්ගේ වගකීම් [6]

18. ව්‍යවහාර වන ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූල වීමේ තර්ජනයක් පවතින බවට හැඟවීම් කරන කරුණු සම්බන්ධව කාර්යයේ නියුතු හවුල්කරුගේ අවධානය යොමු වන්නේ නම්, කාර්යයේ නියුතු හවුල්කරු සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම තුළින්, සමාගමෙන්, කාර්යභාරයේ නියුතු කණ්ඩායමෙන් හෝ වෙනත් මූලාශ්‍රවලින් ලබා ගන්නා අදාළ තොරතුරු භාවිතා කර තර්ජනය තක්සේරු කිරීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. (යොමුවඃ අ43-අ44 ඡේද)

19. කාර්යය භාරයේ නියුතු හවුල්කරු විගණන කාර්ය භාරය පුරාවටම නිරීක්ෂණය කිරීම සහ අවශ්‍ය පරිදි විමසීම් කිරීම තුළින් කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් විසින් ව්‍යවහාරික ආචාර ධර්ම අවශ්‍යතා හෝ සමාගමේ අදාළ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි උල්ලංඝනය කිරීම් සඳහා යොමු වී ඇත්ද යන්න පිළිබඳව අවදියෙන් සිටිය යුතුය (යොමුවඃ අ45 ඡේදය)

20. සමාගමේ තත්ත්ව කළමණාකරන පද්ධතිය හරහා හෝ වෙනත් මූලාශ්‍ර වලින් විගණන කාර්යයෙහි ස්වභාවය හා තත්ත්වයන් සඳහා ව්‍යවහාරවන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා සපුරා නොමැති බව කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ අවධානයට යොමු කරන්නේ නම්, කාර්යභාරයේ නියුතු හවුල්කරු සමාගමේ අනෙකුත් අය සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. (යොමුවඃ අ46 ඡේදය)

21. විගණන වාර්තාව දාතම් කිරීමට පෙර ස්වාධීනත්වයට අදාල ආචාර ධර්ම අවශ්‍යයතා සපුරා තිබේද යන්න පිළිබඳව තීරණය කිරීමේ වගකීම කාර්යභාරයේ නියුතු හවුල්කරු භාර ගනී.

## විගණන කාර්යභාරයන් භාර ගැනීම සහ සේවාදායක සම්බන්ධතා පවත්වා ගැනීම

22. කාර්යයේ නියුතු හවුල්කරු සේවා දායක සම්බන්ධතාවයන් සහ විගණන කාර්යය පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි අනුගමනය කර ඇති බවත්, මේ සම්බන්ධයෙන් එළැඹෙන නිගමන යෝග්‍ය බවත් තීරණය කරයි. (යොමුවඃ අ49 - අ 52, අ58 ඡේද)

---

[6] *ශ්‍රීලංවිප්‍ර 250 - මූල්‍ය ප්‍රකාශන විගණනයකදී නීති සහ රෙගුලාසි සැළකිල්ලට ගැනීම.*

23. කාර්යභාරයේ නියුතු හවුල්කරු ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා වලට අනුකූලව සහ මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා වලට අනුකූලව විගණන කාර්යය සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී පිළිගැනීමේ සහ අඛණ්ඩ ක්‍රියාවලියේදී සැලකිල්ලට ගත යුතුය. (යොමුවඃ අ53 - අ56 ඡේදය)

24. කලින් දැන සිටියේ නම් සේවා ලාභී සම්බන්ධතාවය හෝ නිශ්චිත කාර්ය භාරය පිළිගැනීමට හෝ දිගටම කරගෙන යාමට පෙර විගණනය භාර නොගැනීමට තුඩුදෙන තොරතුරු කාර්යයේ නියුතු කණ්ඩායමට දැන ගැනීමට ලැබුනේ නම් සමාගමට සහ කාර්යයේ නියුතු හවුල්කරුට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි කාර්ය භාරයේ නියුක්ත හවුල්කරු එම තොරතුරු වහාම සමාගමට සන්නිවේදනය කළ යුතුය. (යොමුවඃ අ57 ඡේදය)

**කාර්ය භාරයේ සම්පත්**

25. විගණන කාර්යයේ ස්වභාවය සහ තත්ත්වයන්, සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි සහ කාර්යයේ නිරත වීමේදී ඇති විය හැකි ඕනෑම වෙනස්කමක් සැලකිල්ලට ගනිමින් කාර්යයේ නියුතු හවුල්කරු විසින් කාර්යය සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සහ සුදුසු සම්පත් නියමිත වේලාවට කාර්යයේ නියුතු කණ්ඩායමට පවරා දී ඇති බව හෝ ලබාදීමට තීරණය කළ යුතුය. (යොමුවඃ අ59-අ70, අ73-අ74, අ79 ඡේද)

26. විගණන කාර්යයේ ස්වභාවය සහ තත්ත්වයන් සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි සහ කාර්යයේ නිරතවීමේදී ඇතිවිය හැකි ඕනෑම වෙනස්කමක් සැලකිල්ලට ගනිමින්, කාර්යයේ නියුතු හවුල්කරු විසින් කාර්යභාරයේ නිරත කණ්ඩායම සහ කාර්යයේ නිරත කණ්ඩායමේ කොටසක් නොවන විගණන කාර්යය ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් ඇතුළුව සාමූහිකව ප්‍රමාණවත් නිපුණතාවය සහ හැකියාවක් ඇති ඍජු සහයෝගය සපයන විගණකවරයකුගේ ඕනෑම බාහිර විශේෂඥයින් සහ අභ්‍යන්තර විගණකවරුන් පිළිබඳව තීරණය කළ යුතුය. (යොමුවඃ අ62, අ71 -අ74 ඡේද)

27. 25 සහ 26 ඡේදවල අවශ්‍යතාවලට අනුකූල වීමේ ප්‍රතිඵලයක් ලෙස විගණන කාර්යයෙහි තත්ත්වයන් තුළ පවරා ඇති හෝ ලබා දී ඇති සම්පත් ප්‍රමාණවත් නොවන හෝ නුසුදුසු බව කාර්යභාරයේ නියුතු හවුල්කරු තීරණය කරයි නම්, කාර්යයේ නිරත වීමට අමතර හෝ විකල්ප සම්පත් පැවරීමේ හෝ ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව සුදුසු පුද්ගලයින් සමග සන්නිවේදනය කිරීම ඇතුළුව කාර්යයේ නියුතු හවුල්කරු සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. (යොමුවඃ අ75-අ78 ඡේද)

28. විගණන කාර්යයේ ස්වභාවය සහ ලබා දී ඇති තත්ත්වයන් මත කාර්යයේ නියුතු කණ්ඩායමට පවරා ඇති හෝ ලබා දී ඇති සම්පත් නිසි ලෙස භාවිත කිරීමේ වගකීම කාර්යයේ නියුතු හවුල්කරු භාරගත යුතුය. (යොමුවඃ අ63 - අ69 ඡේද)

**කාර්යයේ කාර්ය සාධනය**

*මෙහෙයවීම අධීක්ෂණය, සහ කාර්ය සාධනය*

29. කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් මෙහෙයවීම හා අධීක්ෂණය සහ ඔවුන්ගේ වැඩ කටයුතු සමාලෝචනය කිරීම පිළිබඳ වගකීම කාර්යයේ නියුතු හවුල්කරු භාරගත යුතුය. (යොමුවඃ අ80 ඡේදය)

30. කාර්යයේ නියුතු හවුල්කරු විසින් මෙහෙයවීමේ සහ සමාලෝචනයේ ස්වභාවය, වේලාව සහ ප්‍රමාණය තීරණය කළ යුත්තේඃ (යොමුවඃ අ81 - අ89, අ94 - අ97 ඡේද)

(අ) සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි, වෘත්තීය ප්‍රමිතීන් සහ අදාල නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සැලසුම් කිරීම[7] සහ ක්‍රියාත්මක කිරීම; සහ

(ආ) විගණන කාර්යයේ ස්වභාවය සහ තත්ත්වයන් සහ සමාගම විසින් කාර්යයේ නියුතු කණ්ඩායමට පවරා ඇති හෝ ලබා දී ඇති සම්පත් වලට ප්‍රතිචාර දැක්වීම.

31. කාර්යයේ නියුතු හවුල්කරු සුදුසු වේලාවන්හිදී පහත කරුණු හා සම්බන්ධ විගණන ලිය කියවිලි ඇතුළුව විගණන ලේඛන සමාලෝචනය කළ යුතුය. (යොමුවඃ අ90 - අ93 ඡේද)

---

[7] ශ්‍රීලංවිප්‍ර 300- මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරීම

(අ) වැදගත් කරුණු [8]

(ආ) විගණන කාර්යය අතරතුරදී හඳුනාගත් දුෂ්කර හෝ මතභේදාත්මක කරුණු හා එළඹුණු නිගමන ඇතුළුව වැදගත් විනිශ්චයන්; සහ

(ඇ) කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ වෘත්තිය විනිශ්චයේ දී කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ වගකීම්වලට අදාළ වන වෙනත් කරුණු.

32. විගණකගේ වාර්තාවේ දිනට හෝ ඊට පෙර විගණන ලේඛන සමාලෝචනය කිරීම සහ කාර්යභාරයේ නියුතු කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීම තුළින් එළැඹෙන නිගමනවලට සහාය දැක්වීමට සහ විගණන වාර්තාව නිකුත් කිරීමට ප්‍රමාණවත්, යෝග්‍ය විගණන සාක්ෂි ලැබී ඇති බවට කාර්යභාරයේ නියුතු හවුල්කරු විසින් තීරණය කළ යුතුය (යොමුවඃ අ90 - අ94 ඡේද)

33. කාර්යයේ නියුතු හවුල්කරු විගණකගේ වාර්තාව දාතම් කිරීමට පෙර අදාල වන්නේ නම්, නිකුත් කිරීමට අදාළ වාර්තාව තත්ත්වයන් යටතේ යෝග්‍යදැයි තීරණය කිරීම පිණිස ප්‍රධාන විගණන කරුණු [9] සහ අදාල විගණන ලේඛන පිළිබඳ විස්තර ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව සමාලෝචනය කළ යුතුය.[10]

34. කාර්යයේ නියුතු හවුල්කරු පාලනය හෝ නියාමන අධිකාරින් සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ අය පිළිබඳව කළමනාකරණයට ඔවුන්ගේ විධිමත් ලිඛිත සන්නිවේදන නිකුත් කිරීම් වලට පෙර සමාලෝචනය කළ යුතුය. (යොමුවඃ අ98 ඡේදය)

*උපදේශන ලබා ගැනීම*

35. කාර්යයේ නියුතු හවුල්කරු විසින්;

(අ) කාර්යයේ නියුතු කණ්ඩායම සඳහා උපදේශන ලබා ගැනීම සඳහා වගකීම භාර ගැනීමේදීඃ

(i) දුෂ්කර හෝ විවාදාත්මක කරුණු සහ සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වලට උපදේශන අවශ්‍ය වන කරුණු; සහ

(ii) කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ වෘත්තීය විනිශ්චයට අනුව උපදේශනය අවශ්‍ය වන අනෙකුත් කරුණු;

(ආ) කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් කාර්යය සිදුකරන අතරතුර කාර්යයේ නිරත කණ්ඩායම තුළ සහ සමාගම තුළ හෝ ඉන් පිටත යෝග්‍ය මට්ටමේ සිටින කාර්යමණ්ඩල සාමාජිකයින් සහ අනෙකුත් අය අතර සුදුසු උපදේශන ලබාගෙන ඇති බව තීරණය කිරීම;

(ඇ) එවැනි උපදේශකයන්ගේ ස්වභාවය සහ විෂය පථය සහ ප්‍රතිඵලය වන නිගමනයන්, උපදෙස් ලබාගත් පාර්ශවයේ එකඟතාවය මත බවට තීරණය කිරීම;

(ඈ) එකඟ වූ නිගමන ක්‍රියාත්මක කර ඇති බව තීරණය කිරීම.

*කාර්යයේ තත්ත්වය සමාලෝචනය*

36. කාර්යයෙහි තත්ත්ව සමාලෝචනයක් අවශ්‍ය වන විගණන කාර්යයන් සඳහා කාර්යභාරයේ හවුල්කරු විසින්ඃ (යොමුවඃ අ103 ඡේදය)

---

8 ශ්‍රීලංවිප්‍ර 230, විගණන ලේඛනගත කිරීම

9 ශ්‍රීලංවිප්‍ර 701 - ස්වාධීන විගණකවරයාගේ වාර්තාවේ කරුණු සන්නිවේදනය

10 ශ්‍රී,ංවිප්‍ර 700 (සංශෝධිත), මූල්‍ය ප්‍රකාශන හෝ ශ්‍රීලංවිප්‍ර 705 (සංශෝධිත), ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට වෙනස් කිරීම් පිළිබඳ මතයක් සැකසීම සහ වාර්තා කිරීම කිරීම

(අ) කාර්යයෙහි තත්ත්ව සමාලෝචකයකු පත්කර ඇති බවට තීරණය කළ යුතුය;

(ආ) කාර්යයෙහි තත්ත්ව සමාලෝචක සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ එසේ කිරීමට ඇති ඔවුන්ගේ වගකීම පිළිබඳව කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට දැනුම් දිය යුතුය;

(ඇ) කාර්යයෙහි තත්ත්ව සමාලෝචනයේ දී හඳුනාගත් කරුණු ඇතුළුව විගණන කටයුතුවලදී පැන නගින සැලකිය යුතු කරුණු සහ වැදගත් විනිශ්චයන් කාර්යයේ තත්ත්ව සමාලෝචකයා සමඟ සාකච්ඡා කළ යුතුය; සහ

(ඈ) කාර්යයෙහි තත්ත්ව සමාලෝචනය නිමවනතුරු විගණන වාර්තාවේ දිනය සඳහන් නොකිරීම කළ යුතුය. (යොමුව: අ104 - අ106 ඡේද)

*මතයේ වෙනස් වීම්*

37. කාර්යයේ නියුතු කණ්ඩායමට උපදේශන සපයන අය ඇතුළුව කාර්යයේ නියුතු කණ්ඩායම සහ කාර්යයෙහි තත්ත්ව සමාලෝචක හෝ සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය තුළ ක්‍රියාකාරකම් සිදුකරන පුද්ගලයින් අතර මතභේද ඇතිවුවහොත්, එවැනි මතභේද සමඟ කටයුතු කිරීම සහ විසඳීම සඳහා සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතුය. (යොමුව: අ107 - අ108 ඡේද)

38. කාර්යයේ නියුතු හවුල්කරු විසින්:

(අ) සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වලට අනුකූලව ආමන්ත්‍රණය කර විසඳීමට ඇති මතභේද සඳහා වගකීම භාරගත යුතුය;

(ආ) එළඹෙන නිගමන ලේඛනගත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට තීරණය කළ යුතුය; සහ

(ඇ) කිසියම් මතභේදයක් විසඳන තුරු විගණකගේ වාර්තාව දාතම් නොකළ යුතුය.

**අධීක්ෂණය සහ ප්‍රතිකර්ම**

39. කාර්යභාරයේ නියුතු හවුල්කරු පහත දේ පිළිබඳ වගකීම භාරගත යුතුය: (යොමුව: අ109 - අ112 ඡේද)

(අ) සමාගම විසින් සන්නිවේදනය කරන ලද අන්දමට අදාළ වන පරිදි ජාලය සහ ජාල සමාගම් හරහා අධීක්ෂණ සහ ප්‍රතිකර්ම ක්‍රියාවලියෙන් ලබාගත් තොරතුරු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම;

(ආ) විගණන කාර්යයට 39 (අ) ඡේදයේ සඳහන් තොරතුරුවල අදාලත්වය සහ බලපෑම තීරණය කිරීම සහ සුදුසු පියවර ගැනීම; සහ

(ඇ) සමාගමේ අධීක්ෂණ සහ ප්‍රතිකර්ම ක්‍රියාවලියට අදාළ විය හැකි තොරතුරු පිළිබඳව විගණන කාර්යය පුරාවට අවධානයෙන් සිටීම සහ ක්‍රියාවලිය සඳහා වගකිවයුතු අයට එවැනි තොරතුරු සන්නිවේදනය කිරීම.

**ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සඳහා සමස්ත වගකීම භාර ගැනීම**

40. විගණන වාර්තාව දාතම් කිරීමට පෙර, කාර්යයේ නියුතු හවුල්කරු විසින් විගණන කාර්යයේ ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සමස්ත වගකීම භාරගෙන ඇති බව තීරණය කළ යුතුය. එසේ කිරීමේදී, කාර්යයේ නියුතු හවුල්කරු විසින් පහත කරුණු තීරණය කළ යුතුය: (යොමුව: අ113 - අ116 ඡේද)

(අ) කාර්යයේ ස්වභාවය සහ තත්ත්වයන් අනුව සිදුකරන ලද සැළකිය යුතු විනිශ්චයන් සහ එළැඹෙන නිගමන උචිත බව තීරණය කිරීමේ පදනම කාර්යයේ නියුතු හවුල්කරුට විගණන කාර්යය පුරාවට ඇති පරිදි කාර්යයේ නියුතු හවුල්කරුගේ මැදිහත්වීම ප්‍රමාණවත් සහ යෝග්‍ය වී ඇති බව; සහ

(ආ) මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා වලට අනුකූල වීමේදී විගණන කාර්යයෙහි ස්වභාවය සහ තත්ත්වයන්, එහි යම් වෙනස්කම් සහ සමාගමේ අදාල ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි සැලකිල්ලට ගෙන ඇති බව.

**ලේඛනගත කිරීම**

41. ශ්‍රීලංවිප්‍ර 230,[11] ව්‍යවහාර කිරීමේදී විගණක විසින් ලේඛනගත කිරීම් වලට පහත ලියකියවිලි ඇතුළත් කළ යුතුය. (යොමුව: අ117 - අ120 ඡේද)

(අ) පහත දෑ පිළිබඳ හඳුනාගත් කරුණු, පිරිස් සමග කරන ලද අදාළ සාකච්ඡා සහ නිගමන වලට එළඹීම්:

(i) ස්වාධීනත්වයට සම්බන්ධ ඒවා ඇතුළුව, අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවලට අදාළ වගකීම ඉටු කිරීම;

(ii) සේවා ලාභී සම්බන්ධතාවයේ පිළිගැනීම සහ අඛණ්ඩ පැවැත්ම සහ විගණන කාර්ය භාරය;

(ආ) විගණන කාර්යය සිදු කරන අතරතුර, භාරදූන් උපදේශනවල ස්වභාවය හා විෂය පථය සහ නිගමන සහ ප්‍රතිඵලය වූ එවැනි නිගමන ක්‍රියාත්මක කළ ආකාරය;

(ඇ) විගණන කාර්යය, කාර්යයේ තත්ත්ව සමාලෝචනයකට යටත් වන්නේ නම්, විගණකගේ වාර්තාවේ දිනට හෝ ඊට පෙර කාර්යයේ තත්ත්ව සමාලෝචනය අවසන් කර තිබීම.

* * *

**ව්‍යවහාරකරණය සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු**

**මෙම ශ්‍රීලංවිප්‍ර විෂය පථය** (යොමුව: 1 ඡේදය)

අ1. සමූහ මූල්‍ය ප්‍රකාශන විගණන ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සියළුම විගණන සඳහා මෙම ශ්‍රී ලංවිප්‍ර ව්‍යවහාර වේ. ශ්‍රීලංවිප්‍ර 600[12] සමූහ මූල්‍ය ප්‍රකාශන වල විගණනයකට සහ සංරචක විගණකවරුන් සම්බන්ධ වූ විට විශේෂ සළකා බැලීම් සමඟ කටයුතු කරයි. ශ්‍රීලංවිප්‍ර 600 අවස්ථාවන්ට අවශ්‍ය පරිදි අනුවර්තනය කරන ලද අතර, කාර්යයේ නියුතු කණ්ඩායමකට වෙනත් සමාගමක පුද්ගලයින් ඇතුළත් වන මූල්‍ය ප්‍රකාශන විගණනයකදී ද ප්‍රයෝජනවත් විය හැකිය. උදාහරණයක් වශයෙන්, ශ්‍රීලංවිප්‍ර 600 දුරස්ථ ස්ථානයක පිහිටි හවුල් සේවා මධ්‍යස්ථානයක භෞතික ඉන්වෙන්ට්‍රි ගණන් කිරීමකට දේපළ, පිරියත සහ උපකරණ පරීක්ෂා කිරීමට හෝ විගණන ක්‍රියාපටිපාටි සිදු කිරීමට එවැනි පුද්ගලයකු සම්බන්ධ කර ගැනීමේදී ශ්‍රීලංවිප්‍ර 600 ප්‍රයෝජනවත් විය හැකිය.

**සමාගමෙහි තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහ කාර්යයේ නියුතු කණ්ඩායමේ කාර්ය භාරය** (යොමුව : 2-9 ඡේද)

අ2. SLSQM 1 එහි තත්ත්ව කළමනාකරණ පද්ධතිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ සමාගමක වගකීම් සමඟ කටයුතු කරයි.

අ3. තත්ත්ව කළමනාකරණ පද්ධතියේ සංරචක විස්තර කිරීමට සමාගම් හෝ ජාතික අවශ්‍යතා විවිධ පාරිභාෂිතයන් හෝ රාමු භාවිතා කළ හැක. ඔවුන් SLSQM 1හි අවශ්‍යතා සපුරාලන විට සහ SLSQM 1 හි පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගමට බැඳීම් පනවන විට, තත්ත්ව කළමනාකරණ පද්ධතියක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමේ වගකීම් සමඟ කටයුතු කරන ජාතික අවශ්‍යතාවයන්ට අවම වශයෙන් SLSQM 1 තරම් ඉල්ලුමක් පවතී.

*සමාගමේ තත්ත්ව කළමනාකරන පද්ධතියට අදාළව සම්බන්ධ වීමේදී කාර්යයේ නියුතු කණ්ඩායමේ වගකීම්.* (යොමුව: 4 ඡේද)

අ4. සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය මගින් සහ විගණන කටයුතුවල නිශ්චිත ස්වභාවය සහ තත්ත්වයන් දැනුම් දෙනු ලැබීම මගින් කාර්යයේ මට්ටමින් තත්ත්ව කළමනාකරණයට සහාය වේ. උදාහරණයක් ලෙස,

[11] ශ්‍රීලංවිප්‍ර 230 - 8-11 සහ අ6 ඡේද

[12] ශ්‍රීලංවිප්‍ර 600 - විශේෂ සළකාබැලීම් - සමූහ මූල්‍ය ප්‍රකාශන විගණන (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුලත්ව)

එවැනි සන්නිවේදනයන් සංකීර්ණ තාක්ෂණික හෝ ආචාර ධර්ම කරුණු හා සම්බන්ධ ඇතැම් අවස්ථාවන්හිදී නම් කරන ලද පුද්ගලයින් සමග උපදේශන ලබා ගැනීමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ආවරණය කළ හැකිය. නැතහොත් විශේෂිත කරුණුවලට අදාළ විගණන ක්‍රියාපටිපාට සිදුකිරීම සඳහා සමාගම විසින් නම් කරන ලද විශේෂඥයින් සම්බන්ධ කර ගැනීම. (උදා. මූල්‍ය ආයතන වල විගණනයේදී අපේක්ෂිත ණය අලාභ දීමනා විගණනය කිරීමට නම් කරන ලද ණය විශේෂඥයින් සම්බන්ධ විය යුතුය)

අ5 සමාගම් මට්ටමේ ප්‍රතිචාරවලට ජාලයක් මගින් හෝ එම ජාලය තුළම ඇති වෙනත් සමාගම්, ව්‍යුහයන් හෝ සංවිධාන විසින් ස්ථාපිත ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ඇතුළත් විය හැකිය. (ජාල අවශ්‍යතා හෝ ජාල සේවා SLSQM 1 හි “ජාල අවශ්‍යතා හෝ ජාල සේවා” කොටසෙහි තවදුරටත් විස්තර කෙරේ.[13] මෙම ශ්‍රීලංවිප්‍රහි අවශ්‍යතා පදනම් වී ඇත්තේ විගණන කටයුතුවලදීමා.යතා හෝ ජාල සේවා ක්‍රියාත්මක කිරීමට හෝ භාවිතා කිරීමට කාර්යයේ නියුතු කණ්ඩායම්වලට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සමාගම වගකිවයුතු බවට වූ පරිසරය මතය. (උදාහරණයක් ලෙස ජාල සමාගමක් විසින් භාවිත කිරීම සඳහා සංවර්ධනය කරන ලද විගණන ක්‍රමවේදයක් භාවිත කිරීමේ අවශ්‍යතාවය SLSQM 1 යටතේ සමාගමේ තත්ත්ව කළමනාකරන පද්ධතියට ජාල අවශ්‍යතා හෝ ජාල සේවා ව්‍යවහාර වන ආකාරය සහ ඒවා සැළකිල්ලට ගන්නේ කෙසේද යන්න තීරණය කිරීම සඳහා සමාගම වගකිව යුතුය.[14]

අ6. ගුණාත්මක අවදානම් සඳහා සමහර සමාගම් මට්ටමේ ප්‍රතිචාරයන් කාර්යය මට්ටමින් සිදු නොකරන නමුත් මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවලට අනුකූලවන විට ව්‍යවහාරවේ. උදාහරණයක් වශයෙන්, මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවලට අනුකූල වනවිට කාර්යයේ නියුතු කණ්ඩායමට යැපීමට හැකි සමාගම මට්ටමේ ප්‍රතිචාරවලට ඇතුළත් වන්නේ:

- පිරිස් බඳවා ගැනීම සහ වෘත්තීය පුහුණු ක්‍රියාවලි:
- සමාගමේ ස්වාධීනත්වය නිරීක්ෂණය කිරීමට සහාය වන තොරතුරු තාක්ෂණ (IT) යෙදුම
- සේවා දායක සම්බන්ධතාවයන් සහ විගණන කටයුතු පිළිගැනීමට සහ අඛණ්ඩව පවත්වාගෙන යාමට සහාය වන තොරතුරු තාක්ෂණ යෙදුම් සංවර්ධනය කිරීම; සහ
- විගණන ක්‍රමවේද ස හ ඒ ආශ්‍රිත ක්‍රියාත්මක කිරීමේ මෙවලම් සහ මාර්ගෝපදේශ සංවර්ධනය.

අ7. එක් එක් විගණන කාර්යයේ විශේෂිත ස්වභාවය හා තත්ත්වයන් සහ විගණන කටයුතු අතරතුර සිදුවිය හැකි වෙනස්කම් හේතුවෙන් කාර්ය මට්ටමින් පැන නගින සියලුම අවදානම් හඳුනා ගැනීමට හෝ අදාළ හා සුදුසු ප්‍රතිචාර දැක්වීමට සමාගමකට නොහැකිය. ඒ අනුව මෙම ශ්‍රීලංවිප්‍රහි පරමාර්ථය සපුරාලීම සඳහා සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවල දක්වා ඇති ඒවායින් ඔබ්බට, සම්බන්ධ වීමේ මට්ටමෙන් ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී කාර්යයේ යුතු කණ්ඩායම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරයි.[15]

අ8. කාර්ය මට්ටමේ ප්‍රතිචාර අවශ්‍ය ද යන්න පිළිබඳ කාර්යයේ නියුතු කණ්ඩායමේ තීරණයට (සහ එසේ නම්, එම ප්‍රතිචාර මොනවාද), මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා, කාර්යයේ ස්වභාවය හා තත්ත්වයන් සහ විගණන කාර්යය තුළදී සිදුවන ඕනෑම වෙනස්කමක් පිළිබඳ කාර්යයේ නියුතු කණ්ඩායමේ අවබෝධය බලපා ඇත. උදාහරණයක් වශයෙන්, කාර්යය තුළදී අනපේක්ෂිත තත්ත්වයන් ඇති විය හැකි අතර, මුලින් පවරන ලද හෝ ලබා දී ඇති අයට අමතරව, සුදුසු පළපුරුදු පුද්ගලයින්ගේ සහභාගිත්වය ඉල්ලා සිටීමට කාර්යයේ නියුතු හවුල්කරුට හේතුවිය හැකිය.

අ9. මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවලට අනුකූල වීමට කාර්යයේ නියුතු කණ්ඩායමේ ප්‍රයත්නවල සාපේක්ෂ ශේෂය (එනම්, සමාගමේ ප්‍රතිචාර හා ක්‍රියාත්මක කිරීම සහ සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවල දක්වා ඇති ඒවාට ඔබ්බෙන් කාර්යයේ විශේෂිත ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අතර) වෙනස විය හැකිය. උදාහරණයක් වශයෙන්, සමාගම විසින් විගණන කටයුතු සඳහා අදාළ වන අවස්ථාවන්හිදී භාවිතා කිරීමට විගණන වැඩසටහනක් සැලසුම් කළ හැකිය. (උදා. කර්මාන්තයට විශේෂිත විගණන වැඩසටහනක්) සිදු කළ යුතු ක්‍රියාපටිපාටිවල කාලය සහ ප්‍රමාණය තීරණය කිරීම හැර, කාර්යයේ මට්ටමින් විගණන වැඩසටහනට පරිපූරක විගණන ක්‍රියාපටිපාටි එකතු කිරීමේ අවශ්‍යතාවය අඩු හෝ අවශ්‍ය නොවේ. විකල්පයක් ලෙස, මෙම ශ්‍රීලංවිප්‍රහි නියැලීමේ කාර්ය සාධන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කිරීමෙහි කාර්යයේ නියුතු කණ්ඩායමේ ක්‍රියාකාරකම්, කාර්යයෙහි නිශ්චිත ස්වභාවය සහ තත්ත්වයන් සමඟ කටයුතු කිරීම සඳහා කාර්යයේ මට්ටමින්

[13] SLSQM 1 , 49(ආ) ඡේදය.

[14] SLSQM 1 , 49(අ) ඡේදය

[15] ශ්‍රීලංවිප්‍ර 200 , මූල්‍ය ප්‍රකාශන විගණනයකදී වීගණකවරයාට සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී වෘත්තිය විනිශ්වයක් අවශ්‍ය වේ.

ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ හැකිය. (උදා. සමාගමේ විගණන වැඩසටහන් මඟින් ආවරණය නොවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල අවදානම් විසඳීම සඳහා ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම).

අ10. සාමාන්‍යයෙන් පහත කරුණුවලට හැර, මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවන්ට අනුකූල වීමේ දී සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි මත කාර්යයේ නියුතු කණ්ඩායම රඳා පවතී;

- කාර්යයේ නියුතු කණ්ඩායමේ අවබෝධය හෝ ප්‍රායෝගික අත්දැකීම් මඟින් පෙන්නුම් කරන්නේ සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි කාර්යයේ ස්වභාවය හා තත්ත්වයන් ඵලදායි ලෙස ආමන්ත්‍රණය නොකිරීම; හෝ
- එවැනි ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවල සඵලතාවය පිළිබඳව සමාගම හෝ වෙනත් පාර්ශව විසින් සපයනු ලබන තොරතුරු වෙනත් ආකාරයකින් යෝජනා කිරීම (උදා, සමාගමේ අධීක්ෂණ ක්‍රියාකාරකම්, බාහිර පරික්ෂණ හෝ වෙනත් අදාල මූලාශ්‍ර මඟින් සපයන ලද තොරතුරු සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවන බව පෙන්නුම් කිරීම).

අ11. නිශ්චිත කාර්යයක සන්දර්භය තුළ ගුණාත්මක අවදානම් සඳහා සමාගමේ ප්‍රතිචාර අකාර්යක්ෂම බව හෝ කාර්යයේ නියුතු හවුල්කරුට සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි මත යැපීමට නොහැකි බව (කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් විසින් කරන ලද දැනුවත් කිරීම් ඇතුළුව) කාර්යයේ නියුතු හවුල්කරු දැනුවත් වුවහොත් 39 (ඇ)ඡේදය අනුව එම තොරතුරු සමාගමේ අධීක්ෂණ සහ ප්‍රතිකර්ම ක්‍රියාවලියට අදාළ වන බැවින්, කාර්යයේ නියුතු හවුල්කරු එවැනි තොරතුරු කඩිනමින් සමාගමට සන්නිවේදනය කරයි. උදාහරණයක් ලෙස, විගණන මෘදුකාංග වැඩසටහනක ආරක්ෂක දුර්වලතාවයක් ඇති බව කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයකු හඳුනා ගන්නේ නම්, එම තොරතුරු නියමිත වේලාවට අදාළ පුද්ගලයින්ට සන්නිවේදනය කිරීමෙන් විගණන වැඩසටහන යාවත්කාලීන කිරීමට සහ නැවත නිකුත් කිරීමට පියවර ගැනීමට සමාගමට හැකියාව ලැබේ. ප්‍රමාණවත් සහ සුදුසු සම්පත් සම්බන්ධයෙන් අ70 ඡේදය බලන්න.

කාර්යයේ මට්ටමින් තත්ත්ව කළමනාකරණයට අදාල තොරතුරු (යොමුව: 6 ඡේදය)

අ12 අනෙකුත් ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා වලට අනුකූල වීමෙන්, කාර්යය මට්ටමින් තත්ත්ව කළමනාකරණයට අදාළ තොරතුරු සැපයිය හැකිය. උදාහරණයක් ලෙස, ශ්‍රීලංවිප්‍ර 315 (2019 සංශෝධිත)[16] යටතේ සමාගම සහ එහි පරිසරය පිළිබඳව සැපයෙන තොරතුරු පිළිබඳ අවබෝධය, මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා වලට අනුකූල වීමට අදාළ විය හැකිය. එවැනි තොරතුරු තීරණය කිරීමට අදාළ විය හැක්කේ:

- අධි අවදානම් කරුණු සඳහා පළපුරුදු කණ්ඩායම් සාමාජිකයින් භාවිතා කිරීම හෝ සංකීර්ණ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂඥයන් සම්බන්ධ කර ගැනීම වැනි නිශ්චිත විගණන ක්ෂේත්‍ර සඳහා යෙදවිය යුතු සම්පත්වල ස්වභාවය;
- ස්ථාන කිහිපයක ඇති භෞතික ඉන්වෙන්ට්‍රි ගණනයට සහභාගි වීමට පවරන ලද කණ්ඩායම් සාමාජිකයින් සංඛ්‍යාව වැනි නිශ්චිත විගණන ක්ෂේත්‍ර සඳහා වෙන් කළ යුතු සම්පත් ප්‍රමාණය;
- ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ තක්සේරු අවදානම් මත පදනම්ව කණ්ඩායමේ සාමාජිකයන් විසින් සිදුකරන ලද කාර්යයේ ස්වභාවය, කාලය සහ ප්‍රමාණය සමාලෝචනය කිරීම; හෝ
- ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වල වැඩි අවදානමක් ඇති කරුණුවලට වැඩි කාලයක් වෙන් කිරීම ඇතුළුව අයවැය ගත විගණන වේලාවන් සහ වඩාත් පළපුරුදු ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයින්ගේ කාලය හෝ හඳුනාගත් අවදානම් ඉහළ ලෙසට තක්සේරු කිරීම.

පරිමානය (යොමුව: 2.8) ඡේද)

අ13. කුඩා සමාගමක, සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි මගින් සමාගමේ ගුණාත්මක අවදානම් සඳහා බොහෝ ප්‍රතිචාර සැලසුම් කිරීම සඳහා සමාගම වෙනුවෙන් කාර්යයේ නියුතු හවුල්කරුවෙකු පත් කළ හැකිය. එසේ

[16] ශ්‍රීලංවිප්‍ර 315 (සංශෝධිත), ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම.

කරන්නේ සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතියෙහි කොටසක් ලෙස ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් ඵලදායි ප්‍රවේශයක් විය හැකි බැවිනි. මීට අමතරව, කුඩා සමාගමක ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාට විධිමත් බවින් අඩුවිය හැකිය. උදාහරණ වශයෙන්, සාපේක්ෂව කුඩා විගණන කාර්යයන් සංඛ්‍යාවක් ඇති ඉතා කුඩා සමාගමක ස්වාධීනත්වය නිරීක්ෂණය කිරීම සඳහා ස්ථිර පුළුල් පද්ධතියක් පිහිටුවීමේ අවශ්‍යතාවයක් නොමැති බවට සමාගම විසින් තීරණය කළ හැකි අතර, ඒ වෙනුවට කාර්යභාරයේ නියුතු හවුල්කරු විසින් තනි පුද්ගල මට්ටමින් ස්වාධීනත්වය නිරීක්ෂණය කරනු ලැබේ.

අ14. කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ගේ කාර්යය මෙහෙයවීම, අධීක්ෂණය සහ සමාලෝචනය සම්බන්ධ අවශ්‍යතා අදාළ වන්නේ කාර්යයේ නියුතු හවුල්කරු හැර වෙනත් සාමාජිකයින් සිටී නම් පමණි.

## නිර්වචන

*කාර්යයේ නියුතු කණ්ඩායම (යොමුව 12 (ඈ) ඡේදය)*

අ15. කාර්යයේ නියුතු කණ්ඩායම විවිධ ආකාරවලින් සංවිධානය කළ හැකිය. උදාහරණයක් ලෙස, කාර්යයේ නියුතු කණ්ඩායම් සාමාජිකයින් එකට හෝ විවිධ භූගෝලීය ස්ථාන හරහා ස්ථානගත විය හැකි අතර, ඔවුන් සිදුකරන ක්‍රියාකාරකම් අනුව කණ්ඩායම් වශයෙන් සංවිධානය විය හැකිය. කාර්යයේ නියුතු කණ්ඩායම සංවිධානය වී ඇති ආකාරය කුමක් වුවත්, විගණන ක්‍රියාපටිපාටි[17] සිදුකරන ඕනෑම පුද්ගලයකු විගණන කාර්යයෙහි නිරත වන කණ්ඩායමේ සාමාජිකයෙකි.

ආ16. කාර්යයෙහි නියුතු කණ්ඩායමක නිර්වචනය විගණන කාර්යයෙහි විගණන ක්‍රියාපටිපාටි සිදුකරන පුද්ගලයින් කෙරෙහි අවධානය යොමු කරයි. විගණකවරයාගේ මතය සහ වාර්තාව සඳහා අවශ්‍ය වන විගණන සාක්ෂි මූලික වශයෙන් ලබා ගනු ලබන්නේ විගණනයක් අතරතුර සිදුකරන ලද ක්‍රියාපටිපාටි මගිනි.[18] විගණන ක්‍රියාපටිපාටි අවදානම තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි[19] සහ වැඩිදුර විගණන ක්‍රියාපටිපාටි වලින් සමන්විත වේ.[20] ශ්‍රීලංවිප්‍ර 500හි පැහැදිලි කර ඇති පරිදි විගණන ක්‍රියාපටිපාටි වලට පරීක්ෂා කිරීම, නිරීක්ෂණය, තහවුරු කිරීම, නැවත ගණනය කිරීම, නැවත ක්‍රියාත්මක කිරීම, විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි සහ විමසීම් ඇතුළත් බොහෝ විට යම් සංයෝජනයකින් සිදු කෙරේ.[21] අනෙකුත් ශ්‍රීලංවිප්‍ර වලට විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා නිශ්චිත ක්‍රියාපටිපාටි ද ඇතුළත් විය හැකිය උදාහරණයක් ලෙස, ශ්‍රී ලංවිප්‍ර 520.[22]

අ17. කාර්යයේ නියුතු කණ්ඩායම්වලට පුද්ගලයින් ඇතුළත් වන අතර, විගණන ක්‍රියාපටිපාටි සිදුකරන පහත දැක්වෙන වෙනත් පුද්ගලයින් ද ඇතුළත් විය හැකිය.

(අ) ජාල සමාගමක් ; හෝ

(ආ) ජාල සමාගමක් නොවන සමාගමක් හෝ වෙනත් සේවා සපයන්නෙකු.[23]

උදාහරණයක් ලෙස, සමූහ විගණන කාර්යයෙහි යෙදෙන වෙනත් සමාගමක පුද්ගලයෙකුට සංරචකයක මූල්‍ය තොරතුරු මත භෞතික ඉන්වෙන්ට්‍රි ගණනයකට සහභාගි වීම හෝ දුරස්ථ ස්ථානයක ස්ථාවර වත්කම් භෞතිකව පරීක්ෂා කිරීම වැනි විගණන ක්‍රියාපටිපාටි සිදුකළ හැකිය.

අ18 විගණන ක්‍රියාපටිපාටි සිදුකරන සේවා බෙදා හැරීමේ මධ්‍යස්ථානවල පුද්ගලයින් ද කාර්යයෙහි නියුතු කණ්ඩායම්වලට ඇතුළත් විය හැකිය. උදාහරණයක් ලෙස, පුනරාවර්තන හෝ ස්වභාවයෙන් විශේෂිත වූ විශේෂ කාර්යයන් සුදුසු දක්ෂ පුද්ගල කණ්ඩායමක් විසින් ඉටු කරනු ලබන බවට තීරණය කළ හැකි අතර, එබැවින් එවැනි පුද්ගලයින් කාර්යයේ නියුතු කණ්ඩායමට ඇතුළත් වේ. සමාගම, ජාලය හෝ එකම ජාලය තුළ ඇති වෙනත් සමාගම්, ව්‍යුහයන් හෝ සංවිධාන මගින් සේවා බෙදා හැරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කළ හැකිය.

[17] ශ්‍රීලංවිප්‍ර 500, *විගණන සාක්ෂි අ10* ඡේදය

[18] ශ්‍රීලංවිප්‍ර 200, අ30 ඡේදය

[19] ශ්‍රීලංවිප්‍ර 315 (2019 සංශෝධිත), අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි සම්බන්ධ අවශ්‍යතා සපයයි.

[20] ශ්‍රීලංවිප්‍ර 330, *තක්සේරු කළ අවදානම් සඳහා විගණකගේ ප්‍රතිචාර, පාලන පරීක්ෂණ සහ තහවුරු කිරීමේ ක්‍රියා පටිපාටි ඇතුළු වැඩිදුර විගණන ක්‍රියා පටිපාටිවලට අදාළ අවශ්‍යතා සපයයි.*

[21] ශ්‍රීලංවිප්‍ර 500, අ 14 - අ25 ඡේද

[22] ශ්‍රීලංවිප්‍ර 520, විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි

[23] SLSQM 1, 16(v) ඡේදය

උදාහරණයක් ලෙස, බාහිර තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි පහසු කිරීම සඳහා මධ්‍යගත ශ්‍රිතයක් භාවිත කළ හැකිය.

අ19. කාර්යයේ නියුතු කණ්ඩායම්වලට විගණන කාර්යයන්හි ගිණුම්කරණය හෝ විගණනය පිළිබඳ විශේෂිත ක්ෂේත්‍රයක ප්‍රවීණත්වයක් සහිතව විගණන ක්‍රියාපටිපාටි සිදුකරන පුද්ගලයින් ඇතුළත් විය හැකිය. උදාහරණයක් ලෙස, කාර්යය තුළින් එම පුද්ගලයාගේ සම්බන්ධය උපදේශනයට පමණක් සීමා වී ඇත්නම්, පුද්ගලයකු කාර්යයේ නියුතු කණ්ඩායමට ඇතුළත් නොවේ. (35) සහ අ99 - අ102 ඡේදවල උපදේශනය පිළිබඳ ආමන්ත්‍රණය කර ඇත.

අ20. විගණන කාර්යය, කාර්යයෙහි තත්ත්ව සමාලෝචනයකට යටත් වන්නේ නම්, කාර්යයෙහි තත්ත්ව සමාලෝචකයා සහ කාර්යයෙහි තත්ත්ව සමාලෝචනය සිදුකරන වෙනත් පුද්ගලයින්, කාර්යයෙහි නියුතු කණ්ඩායමේ සාමාජිකයින් නොවේ. එවැනි පුද්ගලයින් විශේෂිත ස්වාධීන අවශ්‍යතාවන්ට යටත් විය හැකිය.

අ21 ඍජු සහාය ලබාදෙන අභ්‍යන්තර විගණකවරයෙකු සහ කාර්යයෙහි කටයුතු කරන විගණකවරයෙකුගේ බාහිර විශේෂඥයෙකු කාර්යයෙහි නියුතු කණ්ඩායමේ සාමාජිකයින් නොවේ.[24] අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යය ඍජු සහාය ධාරිතාවයකින් හෝ බාහිර විශේෂඥයෙකුගේ කාර්යය භාවිතා කරන විට පිළිවෙලින් ශ්‍රීලංවිප්‍ර 610 (2013 සංශෝධිත) සහ ශ්‍රීලංවිප්‍ර 620 මගින් විගණක සඳහා අවශ්‍යතා සහ මාර්ගෝපදේශ සපයනු ලැබේ. මෙම ශ්‍රීලංවිප්‍ර වලට අනුකූල වීම සඳහා විගණකවරයාට ඍජු සහාය ලබාදෙන අභ්‍යන්තර විගණකවරයෙකු විසින් සිදුකරන ලද කාර්යය පිළිබඳ ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සහ විගණකගේ විශේෂඥයයෙකුගේ කාර්යය පිළිබඳව විගණන ක්‍රියාපටිපාටි සිදුකිරීම අවශ්‍ය වේ.

කාර්යයෙහි නියුතු හවුල්කරුගේ වගකීම (යොමුවː 9, 12ආ ඡේද)

අ22. මෙම ශ්‍රීලංවිප්‍ර හි, කාර්යයේ නියුතු හවුල්කරු විසින් අවශ්‍යතාවයක් හෝ වගකීමක් ඉටුකළ යුතු බවට පැහැදිලිවම අදහස් කරන විට කාර්යයෙහි නියුතු හවුල් කරුට අවශ්‍යතාවය සපුරා ලීම සඳහා සමාගමෙන් හෝ කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ගෙන් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය විය හැකිය. (උදා. අවශ්‍ය තීරණය හෝ විනිශ්චය කිරීමට තොරතුරු). උදාහරණයක් වශයෙන්, කාර්යයේ නියුතු හවුල්කරු විසින් විගණන කාර්ය සිදු කිරීම සඳහා කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ට සාමූහිකව යෝග්‍ය නිපුණතා සහ හැකියාවන් ඇති බව තීරණය කිරීමට අවශ්‍ය වේ. කාර්යයේ නියුතු කණ්ඩායමේ නිපුණතාවය සහ හැකියාවන් උචිතද යන්න පිළිබඳව විනිශ්චයක් කිරීමට කාර්යයේ නියුතු හවුල්කරුට කාර්යයේ නියුතු කණ්ඩායම විසින් හෝ සමාගමේ තත්ත්ව කළමනාකරන පද්ධතියෙන් සම්පාදනය කරන ලද තොරතුරු භාවිතා කිරීමට අවශ්‍ය විය හැකිය.

කාර්යයෙහි නියුතු කණ්ඩායමේ සාමාජිකයින් විසින් සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ව්‍යවහාර කිරීම, (යොමුවː 9, 12 (ඇ), 17 ඡේද)

අ23. සමාගමේ තත්ත්ව කළමනාකරන පද්ධතියේ සන්දර්භය තුළ විගණන කටයුතු සඳහා අදාළ වන සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට සමාගමට කාර්යයෙහි යුතු කණ්ඩායමේ සාමාජිකයින් වගකිව යුතුය. වෙනත් සමාගමක කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් කාර්යයේ නියුතු හවුල්කරුගේ සමාගමේ හවුල්කරුවන් හෝ කාර්යය මණ්ඩලය නොවන බැවින් ඔවුන් සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතියට හෝ සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට යටත් නොවිය හැකිය. තවද, වෙනත් සමාගමක ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි හවුල්කරුගේ සමාගමට සමාන නොවිය හැකිය. උදාහරණ වශයෙන්, විශේෂයෙන්ම අනෙක් සමාගම කාර්යයේ නියුතු හවුල්කරුගේ සමාගමට වඩා වෙනස් නීති පද්ධතියක්, භාෂාවක් හෝ සංස්කෘතියක් සහිත අධිකරණ බල ප්‍රදේශයක ඇති විට මගපෙන්වීම, අධීක්ෂණය සහ සමාලෝචනය හා සම්බන්ධ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වෙනස් විය හැකිය. ඒ අනුව, කාර්යයේ නියුතු කණ්ඩායමට වෙනත් සමාගමක පුද්ගලයින් ඇතුළත් නම්, එම පුද්ගලයින්ගේ කාර්යය සම්බන්ධයෙන් සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම හෝ කාර්යයේ නියුතු හවුල්කරු විසින් විවිධ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය විය හැකිය.

අ24. විශේෂයෙන්ම, සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වලට අදාළව පුද්ගලයින්ට අදාළ වන ක්‍රියාමාර්ගවලට වඩා වෙනස් ක්‍රියාමාර්ග ගැනීමට පහත පරිදි වෙනත් සමාගමක පුද්ගලයෙකු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදී සමාගමට හෝ කාර්යයේ නියුතු හවුල්කරුට අවශ්‍ය විය හැකියː

[24] ශ්‍රීලංවිප්‍ර 620, 12 -13 ඡේද සහ ශ්‍රීලංවිප්‍ර 620 (2013 සංශෝධිත ) 21-25 ඡේද බලන්න.

- විගණන කාර්යය ඉටු කිරීමට උචිත නිපුණතා සහ හැකියාවන් ඇත. උදාහරණ වශයෙන්, පුද්ගලයා සමාගමේ බඳවා ගැනීම් සහ පුහුණු ක්‍රියාවලීන්ට යටත් නොවන බැවින් සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි මගින් මෙම තීරණය වෙනත් සමාගමකින් හෝ බලපත්‍රලාභී හෝ ලියාපදිංචි සමාගමකින් තොරතුරු ලබා ගැනීම වැනි වෙනත් ක්‍රියාවන් හරහා කළ හැකි බව සඳහන් කළ හැකිය. ශ්‍රීලංවිප්‍ර 600 හි 19 සහ අ38 ඡේදවල පහත පරිදි සංරචක විගණකවරුන්ගේ නිපුණතාවය සහ හැකියාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා වූ මාර්ගෝපදේශ අඩංගු වේ.

- සමූහ විගණන කාර්යයට අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අවබෝධ කර ගැනීම උදාහරණ වශයෙන්, අදාළ ආචාර ධර්ම අවශ්‍යතා සඳහා සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි සම්බන්ධයෙන් පුද්ගලයා සමාගමේ පුහුණුවට යටත් නොවනු ඇත. පුද්ගලයාට මෙම අවබෝධය විගණන කාර්යයට අදාළ වන අදාල ආචාර ධර්ම අවශ්‍යතාවල විධිවිධාන අඩංගු තොරතුරු, අත් පොත් හෝ මාර්ගෝපදේශ සැපයීම වැනි වෙනත් ක්‍රියාවන් මගින් ලබාගත හැකි බව සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවල සඳහන් කළ හැක.

- ස්වාධීනත්වය තහවුරු කරනු ඇත. උදාහරණ වශයෙන්, පිරිස් නොවන පුද්ගලයින්ට සමාගමේ ස්වාධීන පද්ධති මත සෘජුවම ස්වාධීන ප්‍රකාශ සම්පූර්ණ කිරීමට නොහැකි විය හැක.

අ25 සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාකාරකම්වලට යම් යම් තත්ත්වයන් යටතේ නිශ්චිත ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය වූ විට (උදා: යම් කරුණක් සම්බන්ධයෙන් උපදේශනය) සමාගමේ අදාළ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි පිරිස් නොවන පුද්ගලයින්ට දැනුම් දීම අවශ්‍ය විය හැකිය. එවැනි ද්ගලයින්ට පසුව යම්කිසි තත්ත්වයන් ඇති වුවහොත් කාර්යයේ නියුතු හවුල්කරු දැනුවත් කිරීමට හැකිවන අතර, මෙමගින් සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට අනුකූලව කටයුතු කිරීමට කාර්යයේ නියුතු හවුල්කරුට හැකියාව ලැබේ. උදාහරණ වශයෙන්, සමූහ විගණන කාර්යයකදී, සංරචක විගණකවරයෙකු කිසියම් සංරචකයක මූල්‍ය තොරතුරු පිළිබඳ විගණන ක්‍රියාපටිපාටි සිදු කරන්නේ නම් සහ සමූහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ වන සහ සමූහ විගණකගේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි යටතේ උපදේශනයට[25] යටත්වන දුෂ්කර හෝ විවාදාත්මක කරුණක් හඳුනා ගැනීම, සංරචක විගණකවරයාට මෙම කාරණය පිළිබඳව සමූහ කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් දැනුවත් කිරීමට හැකිවේ.

*සමාගමේ* (යොමුව: 12(ඉ) ඡේදය)

අ26 අදාළ ආචාර ධර්ම අවශ්‍යතා තුළ "සමාගම" යන්නෙහි නිර්වචනය මෙම ශ්‍රීලංවිප්‍ර හි දක්වා ඇති නිර්වචනයෙන් වෙනස් විය හැකිය.

*"ජාලය" සහ "සමාගම් ජාලය" (යොමුව : 12 (ඊ)-12 (උ) ඡේද)*

අ27. අදාල ආචාර ධර්ම අවශ්‍යතා තුලින් "ජාල" හෝ "ජාල සමාගම" යන්නෙහි නිර්වචන මෙම ශ්‍රීලංවිප්‍ර හි දක්වා ඇති ඒවාට වඩා වෙනස් විය හැකිය. ජාල සහ ජාල සමාගම යන යෙදුම සම්බන්ධයෙන් CA ශ්‍රී ලංකා කේතයද මාර්ගෝපදේශ සපයයි. ජාල සහ අනෙකුත් ජාල සමාගම් විවිධ ආකාරවලින් ව්‍යුහගත විය හැකි අතර, සෑම අවස්ථාවකදීම සමාගමට බාහිර වේ. ජාලයට අදාළව මෙම ශ්‍රීලංවිප්‍ර හි ඇති විධිවිධාන, සමාගමේ කොටසක් නොවන නමුත් ජාලය තුළ පවතින ඕනෑම ව්‍යුහයකට හෝ සංවිධාන වලටද අදාළ වේ.

**විගණනවල ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්ව වගකීම** (යොමුව: 13-15 ඡේද)

*ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සඳහා සමස්ත වගකීම භාර ගැනීම.*

අ28 SLSQM 1 අවශ්‍යතා වලට අනුව සමාගම තත්ත්ව කළමනාකරණ පද්ධතිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වන සමාගමේ පාලනය සහ නායකත්වය ආමන්ත්‍රණය කරන ගුණාත්මක අරමුණු පිහිටුවීමට සිදුවේ ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සඳහා වූ කාර්යයේ නියුතු හවුල්කරුගේ කැපවීම, ගුණාත්මකභාවය සඳහා කැපවීමක් පෙන්නුම් කරන ස්ථිර සංස්කෘතියකින් සහය වේ. මෙම ශ්‍රීලංවිප්‍ර හි 13 සහ 14 ඡෙද වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේ දී, කාර්යයේ නියුතු හවුල්කරුට කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට කෙලින්ම සන්නිවේදනය කළ හැකි අතර, පුද්ගලික හැසිරීම් සහ ක්‍රියාවන් හරහා මෙම සන්නිවේදනය ශක්තිමත් කළ හැකිය. (උදා: නායකත්වය උදාහරණ ලෙස) ගුණාත්මකභාවය සඳහා කැපවීමක් පෙන්නුම් කරන සංස්කෘතියක් කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්

[25] 35 ඡේදය බලන්න.

විසින් තවදුරටත් හැඩගස්වා ශක්තිමත් කරනු ලබන්නේ ඔවුන් කාර්යය සිදුකරන විට අපේක්ෂිත හැසිරීම් විදහා දක්වන බැවිනි.

පරිමාණය

අ29 සමාගමෙහි ගුණාත්මකභාවය සඳහා ඇති කැපවීම ප්‍රදර්ශනය කිරීම සඳහා කාර්යයේ නියුතු හවුල්කරුගේ ක්‍රියාවන්හි ස්වභාවය හා ප්‍රමාණය රඳා පවතින්නේ සමාගමේ ප්‍රමාණය,ව්‍යුහය, භූගෝලීය විසුරුම සහ සංකීර්ණත්වය සහ සමාගමේ සහ කාර්යයේ නියුතු කණ්ඩායමේ ස්වභාවය සහ තත්ත්වයන් ඇතුළු විවිධ සාධක මතය. කාර්යයේ නියුතු කණ්ඩායම සාමාජිකයින් ස්වල්පයක් සහිත කුඩා කාර්යයක යුතු කණ්ඩායමක් සමඟ ඍජු අන්තර් ක්‍රියා සහ හැසිරීම් හරහා අපේක්ෂිත සංස්කෘතියට බලපෑම් කිරීමට ප්‍රමාණවත් විය හැකි අතර, බොහෝ ස්ථාන පුරා විසිරී සිටින විශාල කාර්යයක නියුතු විශාල කණ්ඩායමක් සඳහා වඩාත් විධිමත් සංවේදනයන් අවශ්‍ය විය හැකිය.

*ප්‍රමාණවත් සහ යෝග්‍ය සහභාගිත්වය*

අ30 විගණන කාර්යය පුරාවට ප්‍රමාණවත් ලෙස සහ යෝග්‍ය ලෙස සම්බන්ධ වී සිටීම, කාර්යයේ නියුතු හවුල්කරු විසින් පහත කරුණු ඇතුළුව විවිධ ආකාර වලින් ප්‍රදර්ශනය කළ හැකිය.

- මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියාකරන කණ්ඩායමේ සාමාජිකයින්ගේ දිශාව සහ අධීක්ෂණය සහ ඔවුන්ගේ කාර්යය සමාලෝචනය කිරීමේ ස්වභාවය, වේලාව සහ ප්‍රමාණය පිළිබඳ වගකීම භාර ගැනීම; සහ
- එබඳු මග පෙන්වීමේ ස්වභාවයක, කාලය සහ ප්‍රමාණය වෙනස් කිරීම, නියැළීමේ ස්වභාවය සහ අවස්ථාවන්හි සංදර්භය තුළ අධීක්ෂණය සහ සමාලෝචනය.

*සන්නිවේදනය*

අ31 සන්නිවේදනය යනු, මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා කාර්යයේ නියුතු කණ්ඩායම විසින් අදාළ තොරතුරු බෙදා ගන්නා මාධ්‍යයක් වන අතර, එමගින් විගණන කටයුතුවල ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීමට දායක වේ. සන්නිවේදනය කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් අතර හෝ පහත අය සමඟ හෝ විය හැකිය.

(අ) සමාගම (උදාඃ සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අවසාන හෝ මෙහෙයුම් වගකීම පැවරි ඇති අය ඇතුළුව, සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය තුළ ක්‍රියාකාරකම් සිදුකරන පුද්ගලයින්);

(ආ) විගණනයට සම්බන්ධ වෙනත් අය (උදාඃ ඍජු සහාය සපයන අභ්‍යන්තර විගණකවරුන්[26] හෝ විගණකගේ බාහිර විශේෂඥයින්[27] ; සහ

(ඇ) සමාගමට බාහිර පාර්ශවයන් (උදාඃ පාලනය හෝ නියාමන අධිකාරීන් සම්බන්ධයෙන් භාරව සිටින අය).

අ32. විගණන කාර්යයෙහි ස්වභාවය සහ තත්ත්වයන්, කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් සමඟ ඵලදායී සන්නිවේදනය සඳහා සුදුසු මාධ්‍යයන් සම්බන්ධයෙන් හවුල්කරුගේ තීරණ වලට බලපෑ හැකිය. උදාහරණයක් වශයෙන්, සුදුසු මෙහෙයවීම, අධීක්ෂණය හා සුපරීක්ෂණය සහ සමාලෝචනය සඳහා විවිධ භූගෝලීය ස්ථාන හරහා ක්‍රියාත්මක වන විට කාර්යයෙහි නියුතු කණ්ඩායමේ සාමාජිකයින් අතර සන්නිවේදනය පහසු කිරීම සඳහා සමාගමට තොරතුරු තාක්ෂණ යෙදුම් භාවිතා කළ හැකිය.

*වෘත්තීය සංශයභාවය* (යොමුවඃ 7 ඡේදය)

අ33. කාර්යයේ නියුතු හවුල්කරු විගණන කාර්යය පුරාවට කාර්යයේ නියුතු කණ්ඩායමේ සෑම සාමාජිකයකුම වෘත්තිය සංශය භාවයෙන් ක්‍රියා කිරීමේ වැදගත්කම අවධාරණය කිරීම සඳහා වූ වගකීම දරයි. විගණන ක්‍රියා පටිපාටි

[26] ශ්‍රීලංවිප්‍ර 610 ( 2013 සංශෝධිත) අ41 ඡේදය බලන්න

[27] ශ්‍රීලංවිප්‍ර 620 11 (ඇ) සහ අ 30 ඡේද බලන්න.

සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී සහ විගණන සාක්ෂි ඇගයීමේදී වෘත්තිය සංශය භවයේ යෝග්‍ය අභ්‍යාසයට බාධාවක් විය හැකි සමහර විගණන කටයුතුවලට ආවේණික කොන්දේසි මගින් කාර්යයේ නියුතු කණ්ඩායමට පීඩනයක් ඇති කළ හැකිය. ඒ අනුව ශ්‍රීලංවිප්‍ර 300 ට අනුකූලව සමස්ත විගණන උපායමාර්ගය සංවර්ධනය කිරීමේදී විගණන කාර්ය භාරයේ එවැනි කොන්දේසි තිබේද යන්න සහ එසේනම් එවැනි බාධාවන් අවම කිරීම සඳහා සමාගමට හෝ කාර්යයේ නියුතු කණ්ඩායමට ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න සලකා බැලීමට කාර්යයේ නියුතු කණ්ඩායමට අවශ්‍ය විය හැකිය.

අ34. කාර්යය මට්ටමේදී වෘත්තීය සංශය භාවයෙන් ක්‍රියාත්මක කිරීමට ඇති බාධාවලට ඇතුළත් විය හැකි නමුත්, ඒවාට සීමා නොවන කරුණු:

- ඵලදායි ලෙස අවබෝධ කරගැනීම, තක්සේරු කිරීම සහ අවදානම්වලට ප්‍රතිචාර දැක්වීම සහ කළමනාකරණය පිළිබඳ දැනුවත් ප්‍රශ්න කිරීම සඳහා තාක්ෂණික විශේෂඥතාවය හෝ විශේෂිත කුසලතා අවශ්‍ය වන සමාගම්වල විගණනය සඳහා අවශ්‍ය ප්‍රවීණයන් ඇතුළු ප්‍රමාණවත් පළපුරුදු හෝ තාක්ෂණික සුදුසුකම්ලත් සම්පත් භාවිතය අධෛර්යමත් කළ හැකි අයවැය සීමාවන්.

- කාර්යය ඉටු කරන අයගේ මෙන්ම මෙහෙයවීම, අධීක්ෂණය හා සමාලෝචනය කරන අයගේ හැසිරීම් වලට අහිතකර ලෙස බලපෑ හැකි දැඩි කාල සීමාවන්. උදාහරණ වශයෙන්, සංකීර්ණ තොරතුරු ඵලදායී ලෙස විශ්ලේෂණය කිරීමට සීමාවන් බාහිර කාල පීඩන මගින් නිර්මාණය කළ හැකිය.

- සහයෝගිතාවය නොමැතිකම හෝ කළමනාකරණය විසින් පනවන ලද අනවශ්‍ය පීඩනයන්, සංකීර්ණ හෝ මත භේදාත්මක ගැටළු විසඳීමට කාර්යයේ නියුතු කණ්ඩායමට ඇති හැකියාව කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය.

- අස්තිත්වය සහ එහි පරිසරය, එහි අභ්‍යන්තර පාලන ක්‍රමය සහ ව්‍යවහාර කරන මූල්‍ය වාර්තා කරන රාමුව පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීමෙන් නිසි විනිශ්චයක් කිරීමට සහ කළමනාකාරිත්වයේ ප්‍රකාශයන් පිළිබඳ දැනුවත් ප්‍රශ්න කිරීම් වලට කාර්යයේ නියුතු කණ්ඩායමට ඇති හැකියාව සීමා කළ හැකිය.

- විගණන සාක්ෂි මූලාශ්‍ර තෝරා ගැනීමේ දී සහ වඩාත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි මූලාශ්‍රවලින් විගණන සාක්ෂි සෙවීමට කාර්යයේ නියුතු කණ්ඩායමට හේතුවිය හැකි වාර්තා, පහසුකම්, ඇතැම් සේවකයින්, ගනුදෙනුකරුවන්, වෙළෙන්දන් හෝ වෙනත් අය වෙත ප්‍රවේශය ලබා ගැනීමේ දුෂ්කරතා.

- ස්වයංක්‍රීය මෙවලම් සහ ශිල්පීය ක්‍රම මත අධික ලෙස රඳා පැවතීම, කාර්යයේ නියුතු කණ්ඩායම විගණන සාක්ෂි විවේචනාත්මකව තක්සේරු නොකිරීමට හේතු විය හැක.

අ35. අවිඥානිකව හෝ සවිඥානිකව විගණක පක්ෂග්‍රාහීත්වය, කාර්යයේ නියුතු කණ්ඩායමේ වෘත්තීය විනිශ්චයන්ට බලපෑ හැකිය. උදාහරණයක් ලෙස, විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම හෝ විගණන සාක්ෂි ඇගයීම ඇතුළුව. වෘත්තීය සංශයභාවය ක්‍රියාත්මක කිරීමට බාධාවක් විය හැකි අවිඥානිකව විගණක පක්ෂග්‍රාහී වීම පිළිබඳ ව උදාහරණ සහ ඒ නිසා මෙම, හි අවශ්‍යතාවලට අනුකූල වීමේ දී කාර්යයේ නියුතු කණ්ඩායම විසින් කරන ලද වෘත්තීය විනිශ්චයන්හි සාධාරණත්වයට පහත දේ ඇතුළත් විය හැකිය.

- ලබාගත හැකි නැඹුරුව, එය නොපවතින ඒවාට වඩා ක්ෂණිකව මතකයට එන හෝ පහසුවෙන් ලබා ගත හැකි සිදුවීම් හෝ අත්දැකීම් මත වැඩි බරක් තැබීමේ ප්‍රවණතාවකි.

- තහවුරු කිරීමේ නැඹුරුව, එම විශ්වාසයට පටහැනි හෝ සැකය ඇති කරන තොරතුරුවලට වඩා පවතින විශ්වාසයක් තහවුරු කරන තොරතුරු මත වැඩි බරක් තැබීමේ ප්‍රවනතාවයලකි.

- කණ්ඩායම් චින්තනය, නිර්මාණශීලීත්වය හෝ පුද්ගල වගකීම් අධෛර්යමත් කරන කණ්ඩායමක් ලෙස සිතීමේ හෝ තීරණ ගැනීමේ ප්‍රවණතාවකි.

- අවදානම් හෝ වෙනත් විනිශ්චයන් හෝ තීරණ පිළිබඳ නිවැරදි තක්සේරුවක් කිරීමට තමාගේම හැකියාව අධිතක්සේරු කිරීමේ ප්‍රවණතාවක් වන අධි විශ්වාසනීය නැඹුරුව.

- නැංගුරම් නැඹුරුව, එය පසුකාලීන තොරතුරු ප්‍රමාණවත් ලෙස තක්සේරු නොකරන ලද නැංගුරමක් ලෙස ආරම්භක තොරතුරු කොටසක් භාවිතා කිරීමේ ප්‍රවණතාවයකි.

- මානව තර්කනය හෝ පරස් පර විරෝධී තොරතුරු, එවැනි නිමැවුම විශ්වාසදායක ද හෝ අරමුණට සුදුසුද යන ප්‍රශ්න මතු කරන විට පවා ස්වයංක්‍රීය පක්ෂග්‍රාහීත්වය, එය ස්වයංක්‍රීය පද්ධති වලින් ජනනය වන ප්‍රතිදානයට අනුග්‍රහය දැක්වීමේ ප්‍රවණතාවයකි.

අ36. කාර්යයේ මට්ටමෙන් වෘත්තීය සංශයභාවය ක්‍රියාත්මක කිරීමට ඇති වන බාධා අවම කිරීම සඳහා කාර්යයේ නියුතු කණ්ඩායම විසින් ගතහැකි ක්‍රියාමාර්ග වලට ඇතුළත් විය හැකි කරුණුඃ

- විගණන කාර්යයන්හි ස්වභාවය හෝ තත්ත්වයන්හි වෙනස් වීම් පිළිබඳව අවධානයෙන් සිටීමට කාර්යය සඳහා අමතර හෝ විවිධ සම්පත් අවශ්‍ය වන අතර, කාර්යයට සම්පත් වෙන් කිරීම හෝ පැවරීම සඳහා වගකිවයුතු සමාගම තුළ සිටින පුද්ගලයින්ගෙන් අමතර හෝ වෙනත් සම්පත් ඉල්ලා සිටීම.

- අවිඥානිකව හෝ සවිඥානිකව විගණක පක්ෂග්‍රාහීත්වයට ගොදුරු වීමේ අවදානම වැඩි විය හැකි අවදානම හෝ තත්ත්වයන් පිළිබඳව පැහැදිලිවම කාර්යයේ නියුතු කණ්ඩායම දැනුවත් කිරීම (උදා, වැඩි විනිශ්චයක් සම්බන්ධ ක්ෂේත්‍ර) සහ විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩාත් පළපුරුදු සාමාජිකයින්ගෙන් උපදෙස් ලබා ගැනීමේ වැදගත්කම අවධාරණය කිරීම.

- කාර්යයේ නියුතු කණ්ඩායමේ සංයුතිය වෙනස් කිරීම, උදාහරණයක් ලෙස, වැඩි නිපුණතා හෝ දැනුමක් හෝ විශේෂිත විශේෂඥතාවක් ඇති වඩා පළ පුරුදු පුද්ගලයින් කාර්යයට අනුයුක්ත කරන ලෙස ඉල්ලා සිටීම.

- අන්තර් ක්‍රියා කිරීමට අපහසු හෝ අභියෝගාත්මක කළමනාකාරීත්වයේ සාමාජිකයින් සමඟ ගනුදෙනු කිරීමේ දී කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩාත් පළපුරුදු සාමාජිකයින් සම්බන්ධ කර ගැනීම.

- විගණනයේ සංකීර්ණ හෝ විෂය බද්ධ නොවන ක්ෂේත්‍ර සමඟ කාර්යයේ නියුතු කණ්ඩායමට සහාය වීම සඳහා විශේෂිත කුසලතා සහ දැනුම ඇති කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් හෝ විගණකගේ විශේෂඥයෙකු සම්බන්ධ කර ගැනීම.

- කාර්යයේ නියුතු කණ්ඩායමට වඩාත් පළපුරුදු සාමාජිකයින් සම්බන්ධ කර ගැනීමෙන්, නිරතුරු පදනම මත පුද්ගල අධීක්ෂණයක් හෝ ඇතැම් වැඩ පත්‍රිකා පිළිබඳ වඩාත් ගැඹුරු සමාලෝචන සිදු කිරීමෙන් පහත කරුණු පිළිබඳ මෙහෙයවීම, අධීක්ෂණය හෝ සමාලෝචනයේ ස්වභාවය, කාලය සහ ප්‍රමාණය වෙනස් කිරීම:
  - විගණනයේ සංකීර්ණ හෝ විෂය බද්ධ නොවන ක්ෂේත්‍ර;
  - විගණන කටයුතුවල ගුණාත්මකභාවය ළඟා කර ගැනීමට අවදානමක් ඇති ක්ෂේත්‍රඃ
  - වංචා ඇති වීමේ අවදානමක් ඇති ක්ෂේත්‍රඃ සහ
  - නීති හෝ රෙගුලාසි වලට අනුකූල නොවන බවට හඳුනාගෙන තිබීම හෝ සැක කිරීම

- අපේක්ෂණයන් සැකසීම:
  - කාර්යයේ නියුතු කණ්ඩායමේ අඩු පළ පුරුද්දක් ඇති සාමාජිකයින්, කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩාත් පළපුරුදු සාමාජිකයින්ගෙන් හෝ කාර්යභාර හවුල්කරුගෙන් නිරතුරුවම සහ කාලෝචිත ලෙස උපදෙස් ලබාගැනීම; සහ

  - කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩාත් පලපුරුදු සාමාජිකයින් විගණන කාර්යය පුරාවටම කාර්යයේ නියුතු කණ්ඩායමේ අඩු පළපුරුදු සාමාජිකයින් හට සම්බන්ධ කරගෙන හැකි අතර, ඔවුන්ගේ තීක්ෂණ බුද්ධිය, උපදෙස් හෝ සහය සඳහා වන ඉල්ලීම් සඳහා ධනාත්මක හෝ කාලෝචිත ලෙස ප්‍රතිචාර දැක්වීම.

- කළමනාකාරිත්වය අනවශ්‍ය පීඩනයක් එල්ල කරන විට හෝ විගණන සාක්ෂි ලබාගත හැකි වාර්තා, පහසුකම්, ඇතැම් සේවකයින්, ගනුදෙනුකරුවන්, වෙළෙන්දන් හෝ වෙනත් අය වෙත ප්‍රවේශය ලබාගැනීමේ දුෂ්කරතාවයන්ට කාර්යයේ නියුතු කණ්ඩායමට සිදුවන විට, පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය කිරීම.

*කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් වෙත ක්‍රියාපටිපාටි, කාර්යයන් හෝ ක්‍රියාවන් පැවරීම* (යොමුව: (15) ඡේදය)

අ37. කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට ක්‍රියාපටිපාටි, කාර්යයන් හෝ ක්‍රියාවන් පවරා ඇති විට, කාර්යයේ නියුතු හවුල්කරු විසින් පහත පරිදි විවිධ ආකාර වලින් ප්‍රදර්ශනය කරමින් විගණන කාර්යය පුරාවට ප්‍රමාණවත් ලෙස සහ යෝග්‍ය ලෙස සම්බන්ධ විය හැකිය:

- පැවරුම්කරුවන්ට ඔවුන්ගේ වගකීම් සහ අධිකාරියේ ස්වභාවය, පවරා ඇති කාර්යයේ විෂය පථය සහ එහි අරමුණු පිළිබඳව දැනුවත් කිරීම සහ වෙනත් අවශ්‍ය උපදෙස් සහ අදාළ වෙනත් තොරතුරු සැපයීමට;
- පැවරුම් ලබන්නන් මෙහෙයවීම සහ අධීක්ෂණය;
- 29-34 ඡේද වලට අමතරව, එළඹෙන නිගමනය ඇගැයීම සඳහා පැවරුම්ලාභීන්ගේ කාර්යය සමාලෝචනය කිරීම.

**ස්වාධීනත්වයට අදාල ඒවා ඇතුළුව අදාළ ආචාර ධර්ම අවශ්‍යතා** (යොමුව: 16-21 ඡේද)

*අදාළ ආචාරධර්ම අවශ්‍යතා* (යොමුව: *1, 16-21* ඡේද)

අ38. ශ්‍රීලංවිප්‍ර 200[28] අවශ්‍යතා වලට අනුකූලව විගණකවරයා මූල්‍ය ප්‍රකාශන විගණන කාර්යයට අදාළ ස්වාධීනත්වය ඇතුළු අදාළ ආචාරධර්ම අවශ්‍යතාවලට අනුකූල වීම අවශ්‍ය වේ. උදාහරණ ලෙස, ස්වාධීනත්වය සම්බන්ධ ඇතැම් අවශ්‍යතා අදාල විය හැක්කේ ලැයිස්තුගත අස්තිත්ත්වයන්හි විගණන සිදු කරන විට පමණි. ශ්‍රීලංවිප්‍ර 600 හි ඇතුලත් අමතර අවශ්‍යතා සහ මෙම ශ්‍රීලංවිප්‍ර හි ඇතුලත් සංරචක විගණක වරුන් සමඟ ආචාර ධර්ම අවශ්‍යතා පිළිබඳ සන්නිවේදන සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ ඇතුළත් වේ.

අ39. විගණන කාර්යයෙහි ස්වභාවය හා තත්ත්වයන් මත පදනම්ව නීති හෝ රෙගුලාසි වලට අනුකූල නොවීම වැනි අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවල යම් නීතියක් හෝ රෙගුලාසියක් හෝ අංගයක් සම්බන්ධ වීමට අදාල විය හැකිය. උදාහරණයක් ලෙස, මුදල් විශුද්ධිකරණය, දූෂණය හෝ අල්ලස් සම්බන්ධයෙන් කටයුතු කරන නීති හෝ රෙගුලාසි.

අ40. සමාගමේ තොරතුරු පද්ධතියට සහ සමාගම විසින් සපයනු ලබන සම්පත්වලට, විගණන කාර්යයෙහි ස්වභාවය සහ තත්ත්වයන්ට අදාළ වන ව්‍යවහාරික ආචාර ධර්ම අවශ්‍යතා අවබෝධ කර ගැනීමට කාර්යයේ නියුතු කණ්ඩායමට සහය විය හැකිය. උදාහරණයක් ලෙස, සමාගමට පහත ක්‍රියා සිදු කළ හැකිය;

- කාර්යයේ නියුතු කණ්ඩායම් වෙත ස්වාධීන අවශ්‍යතා සන්නිවේදනය කිරීම.
- අදාල ආචාර ධර්ම අවශ්‍යතා පිළිබඳව කාර්යයේ නියුතු කණ්ඩායම සඳහා පුහුණුව ලබාදීම.
- සමාගමේ ස්වභාවය සහ තත්ත්වයන් සහ එහි කාර්යයන් තුල ඒවා ව්‍යවහාර කෙරෙන ආකාරය පිළිබඳව වූ අදාල ආචාර ධර්ම අවශ්‍යතා සහ මඟපෙන්වීම් වල විධිවිධාන අඩංගු අත්පොත් සහ මාර්ගෝපදේශ (එනම්, බුද්ධිමය සම්පත්) ස්ථාපිත කිරීම.
- අදාළ ආචාර ධර්ම අවශ්‍යතා සමඟ අනුකූල වීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පිරිස් පත් කිරීම (උදා. SLSQM 1 හි අවශ්‍යතා අනුව සමාගම අවම වශයෙන් ස්වාධීනවීමට අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අනුව අවශ්‍ය සියළුම පුද්ගලයින්ගෙන් ස්වාධීන අවශ්‍යතාවලට අනුකූල වීම පිළිබඳ ලිඛිත තහවුරු කිරීමක් වාර්ෂිකව ලබාගැනීම) හෝ අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවලට අදාළ කරුණු සම්බන්ධයෙන් උපදේශන සැපයීම.
- කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් සඳහා අදාළ සහ විශ්වාසදායක තොරතුරු සමාගම තුළ සුදුසු පාර්ශව වෙත හෝ කාර්යයේ නියුතු හවුල්කරු වෙත සන්නිවේදනය කිරීම සඳහා ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරීම, එනම්, කාර්යයේ නියුතු කණ්ඩායම් සඳහා ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි:
  - සහතික නොවන සේවා ඇතුළුව, ගනුදෙනුකරුගේ කාර්යයන් සහ සේවා විෂය පථය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම මඟින් කාර්යයෙහි කාලසීමාව තුල සහ විෂය කරුණු ආවරණය වන කාලසීමාව තුළ ස්වාධීනත්වයට ඇති තර්ජන හඳුනාගැනීමට සමාගමට හැකි වීම.

[28] ශ්‍රීලංවිප්‍ර 200, 14 සහ අ16 - අ19 ඡේද

- ස්වාධීනත්වයට තර්ජනයක් විය හැකි තත්ත්වයන් සහ සම්බන්ධතාවයන් සන්නිවේදනය කිරීම මගින් සමාගමට එවැනි තර්ජනයක් පිළිගත හැකි මට්ටමක තිබේද යන්න තක්සේරු කළ හැකි අතර, එය එසේ නොවේනම්, තර්ජනය තුරන් කිරීමෙන් හෝ පිළිගත හැකි මට්ටමකට අඩු කිරීමෙන් එය ආමන්ත්‍රණය කිරීම.
- ස්වාධීනත්වයට සම්බන්ධ ඒවා ඇතුළුව අදාල ආචාර ධර්ම අවශ්‍යතා කඩ කිරීම් කඩිනමින් සන්නිවේදනය කිරීම.

අ41. කාර්යයෙහි නියුතු හවුල්කරු අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූලව සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි මත රඳා පවතීද යන්න තීරණය කිරීමේ දී අ40 ඡේදයේ විස්තර කර ඇති තොරතුරු සන්නිවේදනය සහ සම්පත් සැලකිල්ලට ගත හැක.

අ42. අදාළ ආචාර ධර්ම අවශ්‍යතා පිළිබඳව කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් අතර විවෘත සහ ශක්තිමත් සන්නිවේදනයෙන් ද පහත පරිදි සහාය විය හැක:

- විගණන කාර්යය සඳහා විශේෂ වැදගත්කමක් ඇතිවිය හැකි අදාළ ආචාර ධර්ම අවශ්‍යතා වෙත කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ගේ අවධානය යොමු කිරීම; සහ
- කාර්යයේ නියුතු කණ්ඩායමේ අවබෝධය සහ අදාළ ආචාර ධර්ම අවශ්‍යතා සහ සමාගමේ අදාළ ප්‍රතිපත්තිය හෝ ක්‍රියාපටිපාටි සපුරාලීමට අදාළ කරුණු පිළිබඳව හවුල්කරු දැනුවත් කිරීම.

*අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූල වීමට ඇති තර්ජන හඳුනා ගැනීම සහ ඇගයීම.* (යොමුව: 17 - 18 ඡේද)

අ43. SLSQM 1 ට අනුකූලව, කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් සඳහා ස්වාධීනත්වයට සම්බන්ධ ඒවා ඇතුළුව, අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූල වීමේ තර්ජන හඳුනා ගැනීම, ඇගයීම හා ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ඇතුළත් අදාල ආචාර ධර්ම අවශ්‍යතා සම්බන්ධයෙන් ගුණාත්මක අවදානම් ආමන්ත්‍රණය කිරීමට වූ සමාගමේ ප්‍රතිචාර.

අ44 අදාළ ආචාර ධර්ම අවශ්‍යතා තුළ තර්ජන හඳුනා ගැනීම හා ඇගයීම සහ ඒවාට මුහුණ දියයුතු ආකාරය පිළිබඳ විධිවිධාන අඩංගු විය හැකිය. උදාහරණ වශයෙන්, CA ශ්‍රී ලංකා සංග්‍රහය පැහැදිලි කරන්නේ, වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව කාර්යය දුෂ්කරවන තරමට විගණන කටයුතු සඳහා මිල නියම වන ගාස්තුව ඉතා අඩු නම්, වෘත්තීය නිපුණතාවය සහ නිසි සැළකිල්ල යන මූලික මූලධර්මයට අනුකූල වීමට ස්වාර්ථ තර්ජනයක් ඇති විය හැකි බවයි.[29]

*අදාල ආචාර ධර්ම අවශ්‍යතා කඩකිරීම්* (යොමුව: 19 ඡේදය)

අ45. SLSQM 1 ට අනුකූලව, අදාල ආචාර ධර්ම අවශ්‍යතා කඩකිරීම් හඳුනා ගැනීම, සන්නිවේදනය කිරීම, ඇගයීම සහ වාර්තා කිරීම සහ කඩකිරීම්වල හේතු සහ ප්‍රතිවිපාක සඳහා නියමිත වේලාවට නිසිලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරීමට සමාගමට අවශ්‍ය වේ.

*සුදුසු ක්‍රියාමාර්ග ගැනීම* (යොමුව: 20 ඡේදය)

අ46. සුදුසු ක්‍රියාමාර්ග වලට ඇතුලත් විය හැක්කේ, උදාහරණයක් ලෙස:

- අදාල ආචාර ධර්ම අවශ්‍යතා උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත හැකිවන පරිදි සුදුසු පුද්ගලයින් සමඟ සන්නිවේදනය කිරීම හෝ උපදේශනය කිරීම ඇතුළුව, අදාළ විනය ක්‍රියාමාර්ග ඇතුළුව සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.
- පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය කිරීම.
- නියාමන අධිකාරීන් හෝ වෘත්තීය ආයතන සමඟ සන්නිවේදනය කිරීම. සමහර තත්ත්වයන් තුළ නියාමන අධිකාරීන් සමඟ සන්නිවේදනය නීතිය හෝ රෙගුලාසි මගින් අවශ්‍ය විය හැකිය.

[29] CA ශ්‍රී ලංකා සංග්‍රහය , 330.3 අ2 ඡේද

- නීති උපදෙස් ලබා ගැනීම.
- අදාල නීතිය හෝ රෙගුලාසි යටතේ විගණන කාර්යය ආපසු ගැනීම කළ හැකි විට, විගණන කටයුතුවලින් ඉවත්වීම.

*විගණකවරයාගේ වාර්තාව දාතම් කිරීමට පෙර* (යොමුවා: 21 ඡේදය)

අ47. ශ්‍රීලංවිප්‍ර 700 අවශ්‍යතා පරිදි විගණනයට අදාල වන ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූලව විගණක අස්තිත්ත්වයෙන් ස්වාධීන වන බවටත්, මෙම අවශ්‍යතා වලට අනුකූලව විගණකගේ අනෙකුත් ආචාර ධර්ම වගකීම් විගණක විසින් ඉටුකර ඇති බවටත් වූ ප්‍රකාශයන් විගණක වාර්තාවේ ඇතුළත් විය යුතුය.[30] මෙම ශ්‍රීලංවිප්‍ර හි 16-21 ඡේද මගින් අවශ්‍ය ක්‍රියාපටිපාටි සිදු කිරීම තුලින් විගණකගේ වාර්තාවේ මෙම ප්‍රකාශ සඳහා පදනම සපයයි.

*රාජ්‍ය අංශයේ අස්තිත්ත්ව සඳහා විශේෂ සළකා බැලීම්*

අ48. ව්‍යවස්ථාපිත පියවර මගින් රාජ්‍ය අංශයේ විගණක වරුන්ගේ ස්වාධීනත්වය සඳහා ආරක්ෂාව සැපයිය හැකිය. කෙසේ වෙතත්, ව්‍යවස්ථාපිත විගණකවරයා වෙනුවෙන් රාජ්‍ය අංශයේ විගණන සිදුකරන රාජ්‍ය අංශයේ විගණකවරුන් හෝ විගණන සමාගම්, යම් අධිකරණ බල ප්‍රදේශයක ඇති වරමෙහි නියමයන් මත පදනම්ව, 16 ඡේදයට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ ප්‍රවේශයට අනුගත විය යුතුය. මෙයට ඇතුළත් විය හැක්කේ රාජ්‍ය අංශයේ විගණකගේ වරම විගණන කටයුතුවලින් ඉවත්වීමට අවසර නොදෙනම්, ඔවුන් පෞද්ගලික අංශයේ සිටියේ නම් විගණකවරයා ඉවත් කර ගැනීමට යොමු කෙරෙන මතුව ඇති තත්ත්වයන් පිළිබඳ ප්‍රසිද්ධ වාර්තාවක් හරහා හෙළිදරව් කිරීමයි.

**සේවාලාභී සම්බන්ධතා සහ විගණන කටයුතු පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම.** (යොමුව: 22 - 24 ඡේද)

අ49. SLSQM 1 හි අවශ්‍යතාලට අනුව, සමාගම සේවාලාභී සම්බන්ධතා සහ නිශ්චිත කාර්යය පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ගුණාත්මක අරමුණු ස්ථාපිත කිරීම සිදුකරයි.

අ50. සේවා දායක සම්බන්ධතා සහ විගණන කටයුතු පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් එළඹ ඇති නිගමනය සුදු සුදුසු ද යන්න තීරණය කිරීමේ දී පහත දැක්වෙන තොරතුරු වැනි තොරතුරු කාර්යයේ නියුතු හවුල්කරුට උපකාරී විය හැකිය.

- ප්‍රධාන අයිතිකරුගේ, ප්‍රධාන කළමනාකාරීත්වය සහ අස්තිත්ත්වයේ පාලනය භාරව සිටින අයගේ අවංක භාවය සහ ආචාර ධර්ම අගයන්;
- කාර්යය සිදුකිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ සුදුසු සම්පත් තිබේද;
- කළමනාකාරිත්වය සහ පාලනය සම්බන්ධයෙන් භාරව සිටින අය කාර්යයට අදාළව තම වගකීම් පිළිගෙන තිබේද;
- කාර්යයේ නියුතු කණ්ඩායමට කාර්යය සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් ඇතුළුව නිපුණතාවය සහ හැකියාවන් තිබේද; සහ
- වර්තමාන හෝ පූර්ව කාර්යයන්හිදී මතුවූ වැදගත් කරුණු, කාර්යය දිගටම කරගෙන යාම සඳහා හැඟවුම් තිබේද යන්න.

අ51. SLSQM 1 යටතේ, පිළිගැනීම සහ අඛන්ඩ තීරණ ගැනීම සඳහා, වෘත්තීය ප්‍රමිතීන්ට සහ ව්‍යවහාරික නෛතික හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව නියැලීම සිදු කිරීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව විනිශ්චයන් සිදුකිරීමට සමාගමට අවශ්‍ය වේ.කාර්යයේ නියුතු හවුල්කරුට ගනුදෙනුකාර සම්බන්ධතාවයන් සහ විගණන කාර්යය පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් එළඹෙන නිගමන උචිත ද යන්න තීරණය කිරීම සඳහා මේ සම්බන්ධයෙන් සමාගම විසින් සළකා බලන තොරතුරු භාවිතා කළ හැකිය එළඹෙන

[30] ශ්‍රීලංවිප්‍ර 700 (සංශෝධිත) 28(ඇ) ඡේදය

නිගමනවල යෝග්‍යතාවය පිළිබඳව කාර්යයේ නියුතු හවුල්කරුට කනස්සල්ලක් ඇත්නම්, එම නිගමන සඳහා පදනම පිළිගැනීමේ සහ අඛණ්ඩ ක්‍රියාවලියට සම්බන්ධ අය සමග සාකච්ඡා කළ හැක.

අ52. කාර්යයේ නියුතු හවුල්කරු සමාගමේ පිළිගැනීමේ සහ අඛණ්ඩ ක්‍රියාවලියට ඍජුවම සම්බන්ධ වන්නේ නම්, සම්බන්ධිත නිගමනවලට එළඹීමේදී සමාගම විසින් ලබා ගත් හෝ භාවිතා කරන තොරතුරු පිළිබඳව කාර්යයේ නියුතු හවුල්කරු දැනුවත් වනු ඇත. එවැනි ඍජු මැදිහත්වීමක් මගින් සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි අනුගමනය කර ඇති බවට සහ එළඹෙන නිගමන යෝග්‍ය බවට කාර්යයේ නියුතු හවුල්කරුගේ අධිෂ්ඨානය සඳහාද පදනමක් සැපයිය හැකිය.

අ53. පිළිගැනීමේ දී හා අඛන්ඩ ක්‍රියාවලියේදී ලබාගත් තොරතුරු මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවලට අනුකූල වීමට සහ සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් තීරණ ගැනීමට කාර්යයේ නියුතු හවුල්කරුට සහාය විය හැකිය. එවැනි තොරතුරුවලට පහත කරුණු ඇතුළත් විය හැකියඃ

- එය සමූහ විගණනයක්ද යන්න එය ක්‍රියාත්මක වන කර්මාන්තය සහ ව්‍යවහාරික මූල්‍ය වාර්තා කරන රාමුව ඇතුළුව අස්ත්ත්වයේ ප්‍රමාණය, සංකීර්ණත්වය සහ ස්වභාවය පිළිබඳ තොරතුරු;
- අතුරු සහ අවසාන අදියර වැනි වාර්තා කිරීම සඳහා වූ අස්තිත්ත්වයේ කාල සටහන;
- සමූහ විගණනයට අදාළව, මව් සහ එහි සංරචක අතර පාලන සම්බන්ධතාවල ස්වභාවය; සහ
- කාර්යයේ නියුතු කණ්ඩායමේ වැඩකටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහා සමාලෝචනය කෙරෙන ආකාරය මෙන්ම, අවශ්‍ය සම්පත්වල ස්වභාවයට බලපෑ හැකි පෙර විගණන කාර්යයන්හි සිට අස්තිත්ත්වයේ හෝ අස්තිත්ත්වය ක්‍රියාත්මක වන කර්මාන්තයේ වෙනස්කම් සිදුවී තිබේද යන්න.

අ54. පිළිගැනීමේ දී සහ අඛණ්ඩව පවත්වාගෙන යාමේදී ලබාගත් තොරතුරු වෙනත් ශ්‍රීලංවිප්‍ර වල මෙන්ම මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතාවලට අනුකූල වීමේ දී ද ව්‍යවහාර විය හැකිය. උදාහරණයක් ලෙස;

- ශ්‍රීලංවිප්‍ර 210 හි අවශ්‍ය කෙරෙන පරිදි විගණන කාර්යයෙහි නියමයන් පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම;[31]
- ශ්‍රීලංවිප්‍ර 315 (2019 සංශෝධිත) සහ ශ්‍රීලංවිප්‍ර 240 ට අනුව දෝෂයක් හෝ වංචාවක් හේතුවෙන් වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම;[32]
- ශ්‍රීලංවිප්‍ර 600 ට අනුකූලව සමූහ මූල්‍ය ප්‍රකාශන විගණන කාර්යයේදී සමූහය, එහි සංරචක සහ ඒවායේ පරිසරයන් අවබෝධ කර ගැනීම සහ සංරචක විගණකවරුන්ගේ කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා සමාලෝචනය කිරීම;
- ශ්‍රීලංවිප්‍ර 620 ට අනුව විගණකගේ විශේෂඥයෙකු සම්බන්ධ කරගන්නේ ද හා කෙසේද යන්න තීරණය කිරීම; සහ
- ශ්‍රීලංවිප්‍ර 260 (සංශෝධිත)[33] සහ ශ්‍රීලංවිප්‍ර 265[34] ට අනුව අස්තිත්ත්වයේ පාලන ව්‍යුහය.

අ55. නීතිය, රෙගුලාසි හෝ අදාල ආචාර ධර්ම අවශ්‍යතා වලට අනුව අනුප්‍රාප්තික විගණකවරයා විසින් කාර්යය පිළි ගන්නවාද යන්න තීරණය කිරීමට පෙර, පූර්වගාමී විගණකගේ විනිශ්චයේදී, අනුප්‍රාප්තික විගණකවරයා විසින් දැනුවත් වියයුතු යම් කරුණු හෝ තත්ත්වයන් පිළිබඳව දන්නා තොරතුරු සපයන ලෙසට පූර්වගාමී විගණකගෙන් ඉල්ලා සිටිය හැකිය. සමහර තත්ත්වයන් තුල, යෝජිත අනුප්‍රාප්තික විගණකගේ ඉල්ලීම මත, යෝජිත අනුප්‍රාප්තික විගණකවරයාට හඳුනාගෙන ඇති හෝ නීති හො රෙගුලාසි වලට අනුකූල නොවීම පිළිබඳ සැකසහිත තොරතුරු සැපයීමට පූර්වගාමී විගණකට අවශ්‍ය විය හැකිය. උදාහරණ වශයෙන්, පූර්වගාමී විගණක

[31] ශ්‍රීලංවිප්‍ර 210 9 ඡේදය - විගණන කාර්යයෙහි නියමයන්ට එකඟ වීම.

[32] ශ්‍රීලංවිප්‍ර 240, මූල්‍ය ප්‍රකාශණ විගණනයකදී වංචාවට අදාලව විගණකගේ වගකීම.

[33] ශ්‍රීලංවිප්‍ර 260, (සංශෝධිත) පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය.

[34] ශ්‍රීලංවිප්‍ර 265, පාලනය සහ කළමනාකරණය භාරව සිටින අය සමඟ අභ්‍යන්තර පාලනයේ අඩුපාඩු සන්නිවේදනය කිරීම.

විසින් හඳුනාගෙන ඇති හෝ නීති හෝ රෙගුලාසි වලට අනුකූල නොවන බවට සැකකිරීමේ ප්‍රතිඵලයක් ලෙස කාර්යයෙන් ඉවත් වී ඇත්නම්, පූර්වගාමී විගණකගේ මතය අනුව යෝජිත අනු ප්‍රාප්තික විගණකවරයා පත්වීම පිළිගන්නේ ද යන්න තීරණය කිරීමට පෙර දැන සිටිය යුතු එවැනි අනුකූල නොවීම පිළිබඳ තොරතුරු ආදිය යෝජිත අනුප්‍රාප්තික විගණකගේ ඉල්ලීම මත පූර්වගාමී විගණක විසින් අදාළ සියලු කරුණු හා අනෙකුත් තොරතුරු සැපයීමට ශ්‍රී ශ්‍රී ලංකා සංග්‍රහයට අනුව අවශ්‍ය වේ.

අ56. විගණන කාර්යයක් පිළිගැනීමට හෝ දිගටම කරගෙන යාමට සමාගම නීතියෙන් හෝ රෙගුලාසියෙන් බැඳී සිටින අවස්ථාවලදී, කාර්යයේ නියුතු හවුල්කරු විසින් කාර්යයේ ස්වභාවය හා තත්ත්වයන් පිළිබඳව සමාගම විසින් ලබා ගත් තොරතුරු සැලකිල්ලට ගත හැකිය.

අ57. අවශ්‍ය ක්‍රියාමාර්ගය තීරණය කිරීමේ දී කාර්යයේ නියුතු හවුල්කරුට සහ සමාගමට විගණන කටයුතු කරගෙන යාම උචිත බව නිගමනය කළ හැකි අතර, එසේනම් කාර්යයේ මට්ටමින් ගතයුතු අවශ්‍ය අමතර පියවර මොනවාද යන්න තීරණය කළ හැකිය. (උදාහරණ වශයෙන්, වැඩි කාර්ය මණ්ඩලයක් හෝ නිශ්චිත විශේෂඥතාවක් සහිත කාර්යමණ්ඩලයක් පවරාදීම) කාර්යයේ නියුතු හවුල්කරුට තවදුරටත් කනස්සල්ලක් ඇත්නම් හෝ කාරණය නිසි ලෙස විසඳා ඇති බව ද සෑහීමකට පත් නොවන්නේ නම් මතභේද විසඳීම සඳහා සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි අදාල විය හැකිය.

*රාජ්‍ය අංශයේ අස්තිත්ත්ව සඳහා විශේෂිත වූ සලකා බැලීම්* (යොමුව: 22 - 24 ඡේද)

අ58. රාජ්‍ය අංශය තුළ, ව්‍යවස්ථාපිත ක්‍රියාපටිපාටිවලට අනුකූලව විගණකවරුන් පත් කළ හැකි අතර, රාජ්‍ය අංශයේ විගණන වරයාට විගණන කාර්යය පිළිගැනීම හා සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් සියලු ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරීමට අවශ්‍ය නොවනු ඇත. එසේ වුවද, 22-24 සහ අ49-අ57 ඡේදවල දක්වා ඇති පරිදි, සේවා දායක සම්බන්ධතාවයන් සහ කාර්යය පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතා සහ සලකා බැලීම් අවදානම් තක්සේරු කිරීම සිදුකිරීමේදී සහ වාර්තා කිරීමේ වගකීම ඉටුකිරීමේදී රාජ්‍ය අංශයේ විගණකවරුන්ට අගය විය හැකිය.

**කාර්යයෙහි සම්පත්** (යොමුව: 25 - 28 ඡේද)

අ59. SLSQM 1 යටතේ, විගණන කාර්යයන්හි කාර්ය සාධනය සඳහා සහාය වීමට සමාගම විසින් පවරා ඇති හෝ ලබා දී ඇති සම්පත් වලට ඇතුළත් වන්නේ:

- මානව සම්පත්;
- තාක්ෂණික සම්පත්; සහ
- බුද්ධිමය සම්පත් වේ.

අ60. විගණන කාර්යය සඳහා සම්පත් මූලික වශයෙන් පැවරීම හෝ ලබාදීම සිදුකරනු ලබන්නේ සමාගම විසින් නමුත්, විගණන කටයුතු සඳහා සම්බන්ධ වන කණ්ඩායම සෘජුවම සම්පත් ලබාගන්නා අවස්ථා තිබිය හැක. උදාහරණ වශයෙන්, මෙය එසේ විය හැක්කේ සංරචකයක මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් ප්‍රකාශ කිරීමට ව්‍යවස්ථාවකින්, රෙගුලාසියෙන් හෝ වෙනත් හේතුවක් මත සංරචක විගණකවරයෙකු අවශ්‍ය වූ විට සහ කාර්යයෙහි නියැලීමේ කණ්ඩායම වෙනුවෙන් විගණන ක්‍රියාපටිපාටි ඉටු කිරීම සඳහා සංරචක කළමනාකරණය විසින් සංරචක විගණකවරයා ද පත් කරනු ලබන විටය.[35] එවැනි තත්ත්වයන් තුළ සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වලට ප්‍රමාණවත් සහ සුදුසු සම්පත් පවරා තිබේද, නැතහොත් ලබාගත හැකිද යන්න තීරණය කිරීම සඳහා සංරචක විගණකවරයාගෙන් තොරතුරු ඉල්ලා සිටීම වැනි විවිධ ක්‍රියාමාර්ග ගැනීමට හවුල්කරුට අවශ්‍ය විය හැකිය.

අ61. 25 සහ 26 ඡේදවල අවශ්‍යතාවලට අනුකූල වීමේදී, කාර්යයෙහි නියුතු හවුල්කරු සඳහා වූ සලකා බැලීමක් වන්නේ, වෘත්තීය නිපුණතාවය සහ නිසි සැලකිල්ල වැනි සදාචාරාත්මක මූලධර්ම ඇතුළුව අදාළ ආචාර ධර්ම අවශ්‍යතා සපුරාලීමට කාර්යයේ නියුතු කණ්ඩායමට පවරා ඇති හෝ ලබා දී ඇති සම්පත් සක්‍රීය කරයිද යන්න විය හැකිය.

[35] ශ්‍රීලංවිප්‍ර 600, 3 ඡේදය

*මානව සම්පත්*

අ62. මානව සම්පත් වලට කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් (අ5, අ15 - අ21 ඡේද ද බලන්න) සහ අදාල වන විට, විගණකවරයෙකුගේ බාහිර විශේෂඥයෙකු සහ විගණනය සඳහා සෘජු සහය ලබාදෙන අස්තිත්ත්වයේ අභ්‍යන්තර විගණන කාර්යයෙහි නිරත පුද්ගලයින් වේ.

*තාක්ෂණික සම්පත්*

අ63. විගණන කාර්යය සඳහා තාක්ෂණික සම්පත් භාවිතයෙන් ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට විගණකවරයාට සහාය විය හැකිය. තාක්ෂණික මෙවලම් මගින් විගණනය වඩාත් ඵලදායී ලෙස සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට විගණක හට ඉඩ සැලසිය හැකිය. තාක්ෂණික මෙවලම් මගින් විගණක වරයාට විශාල දත්ත ප්‍රමාණයක් පහසුවෙන් ඇගයීමට ඉඩ සැලසිය හැක. උදාහරණයක් වශයෙන්, ගැඹුරු තීක්ෂණ බුද්ධියක් සැපයීම, අසාමාන්‍ය ප්‍රවණතා හඳුනා ගැනීම හෝ කළමනාකරණයේ ප්‍රකාශයන් වඩාත් ඵලදායී ලෙස අභියෝගයට ලක් කිරීම, එමගින් වෘත්තීය සංශය භාවය ක්‍රියාත්මක කිරීමට විගණකවරයාගේ හැකියාව වැඩිදියුණු කිරීම ආදිය වේ. රැස්වීම් පැවැත්වීමට සහ කාර්යයෙහි නියුතු කණ්ඩායමට සන්නිවේදන මෙවලම් සැපයීමට ද තාක්ෂණික මෙවලම් භාවිතා කළ හැක. එවැනි තාක්ෂණික සම්පත් අනිසි ලෙස භාවිතා කිරීමෙන් කෙසේ වෙතත්, තීරණ ගැනීමේ අරමුණු සඳහා නිපදවන තොරතුරු මත අධික ලෙස රඳා පැවතීමේ අවදානම වැඩි කළ හැකිය නැතහොත්, උදාහරණයක්, වශයෙන් රහස්‍යභාවය සම්බන්ධ අවශ්‍යතා වැනි ආචාර ධර්මවලට අනුකූල වීමට තර්ජන ඇති කළ හැකිය.

අ64. සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට අනුව විගණන ක්‍රියාපටිපාටි සිදුකිරීම සඳහා සමාගම අනුමත තාක්ෂණික මෙවලම් භාවිතා කරන විට,කාර්යයේ නියුතු කණ්ඩායම සඳහා අවශ්‍ය සළකා බැලීම් හෝ වගකීම් ඇතුළත් විය හැකි අතර, නිමැවුම ඇගයීමට හෝ විශ්ලේෂණය කිරීමට විශේෂිත කුසලතා හෝ ප්‍රවීණතාවය ඇති පුද්ගලයින්ගේ සහභාගිත්වය අවශ්‍ය විය හැකිය.

අ65. විගණන ක්‍රියාපටිපාටි සිදුකිරීමේදී විශේෂිත ස්වයංක්‍රීය මෙවලම් සහ ශිල්පීය ක්‍රම භාවිතා කිරීමට වෙනත් සමාගමක පුද්ගලයින්ට කාර්යයේ නියුතු හවුල්කරුට අවශ්‍ය වූ විට, එම පුද්ගලයින් සමග කරන සන්නිවේදනයෙන් එවැනි ස්වයංක්‍රීය මෙවලම් හා ශිල්පීය ක්‍රම භාවිතය කාර්යයේ නියුතු කණ්ඩායමේ උපදෙස්වලට අනුකූල විය යුතු බව පෙන්නුම් කළ හැකිය.

අ66. සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි මගින් ඇතැම් තොරතුරු තාක්ෂණ යෙදුම් හෝ තොරතුරු තාක්ෂණ යෙදුම් වල විශේෂාංග (උදා. සමාගම විසින් භාවිතය සඳහා තවමත් නිශ්චිත අනුමත කර නොමැති මෘදුකාංග) භාවිතය තහනම් කළ හැකිය. විකල්පයක් ලෙස, සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට අනුව භාවිතයට සුදුසු දැයි තීරණය කිරීමට නිශ්චිතව අනුමත නොවන තොරතුරු තාක්ෂණ යෙදුමක් භාවිතා කිරීමට පෙර යම් යම් ක්‍රියා මාර්ග ගැනීමට කාර්යයේ නියුතු කණ්ඩායමට අවශ්‍ය විය හැකිය. එවැනි අවස්ථාවලට උදාහරණයක් වන්නේ:

- කාර්යයේ නියතු කණ්ඩායමට තොරතුරු තාක්ෂණ යෙදුම භාවිතා කිරීමට සුදුසු නිපුණතා සහ හැකියාවන් තිබීම.
- තොරතුරු තාක්ෂණ යෙදුමේ ක්‍රියාකාරිත්වය සහ ආරක්ෂාව පරීක්ෂා කිරීම.
- විගණන ගොනුවට ඇතුළත් කළ යුතු නිශ්චිත ලේඛන.

අ67. කාර්යයේ සන්දර්භය තුල විගණන කාර්යය සඳහා තොරතුරු තාක්ෂණ යෙදුමක් භාවිතා කිරීම සුදුසු ද යන්න සහ එසේනම්, එම තොරතුරු තාක්ෂණ යෙදුම භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව සළකා බැලීමේදී කාර්යයේ නියුතු හවුල්කරු වෘත්තීය විනිශ්චයක් කළ හැකිය. සමාගම විසින් භාවිතය සඳහා විශේෂයෙන් අනුමත කර නොමැති විශේෂිත වූ තොරතුරු තාක්ෂණික යෙදුමක් විගණන කාර්යය සඳහා සුදුසු වේද යන්න තීරණය කිරීමේ දී සළකා බැලිය හැකි සාධකවලට ඇතුළත් වන්නේ:

- තොරතුරු තාක්ෂණ යෙදුමේ භාවිතය සහ ආරක්ෂාව සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම;
- තොරතුරු තාක්ෂණ යෙදුම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වීම;

- තොරතුරු තාක්ෂණ යෙදුම භාවිතා කිරීමට අවශ්‍ය නිපුණතාවයෙන් සහ හැකියාවෙන් යුක්ත පිරිස් සතු වීම.

*බුද්ධිමය සම්පත්*

අ68. බුද්ධිමය සම්පත්වලට උදාහරණ ලෙස, විගණන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේ මෙවලම්, විගණන මාර්ගෝපදේශ, ආකෘතිමය වැඩසටහන්, සැකිලි, පිරික්සුම් ලැයිස්තු හෝ ආකෘති ඇතුළත් වේ.

අ69. විගණන කාර්යය සඳහා බුද්ධිමය සම්පත් භාවිතයෙන් වෘත්තීය ප්‍රමිතීන්, නීති හෝ රෙගුලාසි සහ අදාළ ස්ථිර ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි පිළිබඳ සංගත යෙදීම් සහ අවබෝධය සඳහා පහසුකම් සපයයි. මෙම පරමාර්ථය සඳහා කාර්යයේ නියුතු කණ්ඩායමට, සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට අනුකූලව සමාගමේ විගණන ක්‍රමවේදය සහ විශේෂිත මෙවලම් සහ මඟ පෙන්වීම් භාවිත කිරීමට අවශ්‍ය විය හැකිය. කාර්යයේ ස්වභාවය හා තත්ත්වයන් මත පදනම්ව වෙනත් බුද්ධිමය සම්පත් භාවිතය යෝග්‍ය ද සහ අදාළද යන්න ද, උදාහරණයක් ලෙස, කර්මාන්ත විශේෂිත ක්‍රමවේදයක් හෝ අදාළ මාර්ගෝපදේශ සහ කාර්යය සාධන ආධාරක කාර්යයේ නියුතු කණ්ඩායම විසින් සළකා බැලිය හැකිය.

*කාර්යය ඉටු කිරීමට ප්‍රමාණවත් සහ උචිත සම්පත්* (යොමුව: *25* ඡේදය)

අ70. කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් සහ උචිත සම්පත් කාර්යයේ නියුතු කණ්ඩායමට පවරා තිබේද, නැතහොත් ලබාදී තිබේද යන්න තීරණය කිරීමේ දී, සාමාන්‍යයෙන් කාර්යයේ නියුතු හවුල්කරු අ6 ඡේදයේ විස්තර කර ඇති පරිදි සමාගමේ අදාළ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි (සම්පත් ඇතුළුව) මත රඳා පවතිනු ඇත. උදාහරණයක් ලෙස, සමාගම විසින් සන්නිවේදනය කරන ලද තොරතුරු මත පදනම්ව විගණන ක්‍රියාපටිපාටි සිදුකිරීම සඳහා සමාගම විසින් අනුමත කරන ලද තාක්ෂණය භාවිතා කරන විට සමාගමේ තාක්ෂණික සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු වැඩසටහන් මත යැපීමට කාර්යයේ නියුතු හවුල්කරුට හැකිවේ.

*කාර්යයේ නියුතු කණ්ඩායමේ නිපුණතාවය සහ හැකියාවන්* (යොමුව: *26* ඡේදය)

අ71. කාර්යයේ නියුතු කණ්ඩායමට සුදුසු නිපුණතා සහ හැකියාවන් ඇති බව තීරණය කිරීමේදී, කාර්යය භාර හවුල්කරුට කණ්ඩායම පිළිබඳව පහත කරුණු සැලකිල්ලට ගත හැකිය;

- යෝග්‍ය පුහුණුව සහ සහභාගිත්වය තුළින් සමාන ස්වභාවයක් සහ සංකීර්ණත්වයක් ඇති විගණන කාර්යයන් පිළිබඳ ලැබූ අවබෝධය සහ ප්‍රායෝගික අත්දැකීම.
- වෘත්තීය ප්‍රමිතීන් සහ අදාල නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ අවබෝධය.
- ගිණුම්කරණය හෝ විගණනය පිළිබඳ විශේෂිත ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය.
- අස්තිත්ත්වය විසින් භාවිතා කරන තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය හෝ විගණන කාර්යයේ සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී කාර්යයේ නියුතු කණ්ඩායම විසින් භාවිතා කළ යුතු ස්වයංක්‍රීය මෙවලම් හෝ ශිල්පීය ක්‍රම.
- විගණනය කරනු ලබන අස්තිත්ත්වය ක්‍රියාත්මක වන අදාළ කර්මාන්ත පිළිබඳ දැනුම.
- වෘත්තීය සංශයභාවය සහ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීමේ හැකියාව.
- සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි පිළිබඳ අවබෝධය.

අ72. අභ්‍යන්තර විගණකවරුන් සහ විගණකවරයවරයෙකුගේ බාහිර විශේෂඥයින් කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් නොවේ. ශ්‍රීලංවිප්‍ර 610 (2013 සංශෝධිත)[36] සහ ශ්‍රීලංවිප්‍ර 620[37] හි පිළිවෙලින් අභ්‍යන්තර විගණකවරුන්ගේ සහ විගණකගේ බාහිර විශේෂඥයෙකුගේ නිපුණතා සහ හැකියාවන් තක්සේරු කිරීමට අදාළ අවශ්‍යතා සහ මාර්ගෝපදේශ ඇතුළත් වේ.

[36] ශ්‍රීලංවිප්‍ර 610 (2013 සංශෝධිත) 15 ඡේදය

[37] ශ්‍රීලංවිප්‍ර 620 9 ඡේදය

ව්‍යාපෘති කළමනාකරණය

අ73. කාර්යයෙහි නියුතු කණ්ඩායමේ බොහෝ සාමාජිකයින් සිටින අවස්ථාවන්හිදී උදාහරණයක් ලෙස, විශාල හෝ වඩාත් සංකීර්ණ අස්තිත්ත්වයක විගණනයකදී, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ විශේෂිත නිපුණතා හෝ දැනුමක් ඇති සමාගමේ සුදුසු තාක්ෂණික සහ බුද්ධිමය සම්පත් මගින් අනුග්‍රහය දක්වන පුද්ගලයකු සම්බන්ධ කර ගැනීමේදී කාර්යයේ නියුතු හවුල්කරුට ඊට සම්බන්ධ විය හැකිය. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස, කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් ස්වල්පයක් සහිතව සංකීර්ණත්වයෙන් අඩු අස්තිත්ත්වයක විගණනයකදී ව්‍යාපෘති කළමනාකරණය අඩු විධිමත් ක්‍රම තුලින් කාර්යයෙහි නියුතු කණ්ඩායමේ සාමාජිකයකු මඟින් සාක්ෂාත් කරගත හැක.

අ74. විගණන කාර්යයෙහි ගුණාත්මකභාවය කළමනාකරණය කිරීමේ දී ව්‍යාපෘති කළමනාකරණ ශිල්පීයක්‍රම සහ මෙවලම් මඟින් කාර්යයෙහි නියුතු කණ්ඩායමට සහාය විය හැකිය. උදාහරණයක් ලෙසඃ

- වෙනත් ආකාරයකින් වෘත්තීය සංශයභාවයේ අභ්‍යාසයට බාධාවක් විය හැකි අයවැය හෝ කාලසීමාවන් සමනය කිරීම හරහා කාර්යයෙහි නියුතු කණ්ඩායමට වෘත්තීය සංශයභාවය අභ්‍යාස කිරීමට ඇති හැකියාව වැඩි කිරීම;

- වඩාත් දුෂ්කර හෝ විවාදාත්මක කරුණු මතුවිය හැකි විට විගණන ක්‍රියාවලියක් අවසානයේ කාලසීමාවන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා විගණන වැඩ කටයුතු කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම;

- ප්‍රධාන සන්ධිස්ථාන සාක්ෂාත් කර ගැනීම ඇතුළුව, විගණන සැලැස්මට එරෙහිව විගණනයේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම,[38] විගණන සැලැස්මට සහ පවරා ඇති සම්පත්වලට කාලෝචිත ගැලපීම් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමට ක්‍රියාශීලීව ක්‍රියා කිරීමට කාර්යයේ නියුතු කණ්ඩායමට සහාය විය හැකිවීම; හෝ

- කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් අතර සන්නිවේදනය පහසු කිරීම, උදාහරණයක් ලෙස, සංරචක විගණකවරුන් සහ විගණකගේ විශේෂඥයින් සමග වන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

*ප්‍රමාණවත් නොවන හෝ නුසුදුසු සම්පත්* (යොමුවඃ 27 ඡේදය)

අ75. SLSQM 1 හි, සමාගමේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රමුඛතා ඇතුළුව සමාගමේ උපායමාර්ගික තීරණ සහ ක්‍රියාවන්හි ගුණාත්මක භාවයේ වැදගත්කම පිළිබඳව සමාගම පුරා පවතින සංස්කෘතිය හරහා ගුණාත්මක ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරමින් මහජන සුභ සිද්ධිය සඳහා සේවය කිරීම පිණිස සමාගමේ කාර්ය භාරය හඳුනාගෙන ශක්තිමත් කිරීම සඳහා වූ සමාගමේ කැපවීම ආමන්ත්‍රණය කරයි. SLSQM 1හි, සම්පත් අවශ්‍යතා සඳහා සැලසුම් කිරීම සහ ගුණාත්මකභාවය සඳහා සමාගමේ කැපවීමට අනුකූලවන පරිදි සම්පත් ලබා ගැනීම, වෙන් කිරීම, හෝ පැවරීම සඳහා වූ සමාගමේ වගකීම් පිළිබඳවද ආමන්ත්‍රණය කරයි. කෙසේ වෙතත්, යම් යම් තත්ත්වයන් යටතේ සමාගමේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රමුඛතාවයන්ට අනුව කාර්යයේ නියුතු කණ්ඩායමට පවරා ඇති හෝ ලබා දී ඇති සම්පත්වලට බාධා ඇති විය හැකිය. එවැනි තත්ත්වයන් තුළ, සමාගම විසින් පවරා ඇති හෝ ලබා දී ඇති සම්පත් විගණන කාර්යය ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය බව තීරණය කිරීම ඇතුළුව කාර්යය මට්ටමින් ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යයෙහි නියුතු හවුල්කරුගේ වගකීම මෙම සීමාවන් ඉක්මවා නොයයි.

අ76. සමූහ මූල්‍ය ප්‍රකාශන විගණනයකදී, සංරචක විගණකවරයෙකු විසින් සංරචකයක සිදුකරන කාර්යයට අදාළව ප්‍රමාණවත් හෝ නුසුදුසු සම්පත් ඇති විට, කාර්යයේ නියුතු හවුල්කරුට ප්‍රමාණවත් සහ සුදුසු සම්පත් ලබා ගැනීම සඳහා සංරචක විගණක, කළමනාකාරිත්වය හෝ සමාගම සමඟ මෙම කරුණ සාකච්ඡා කළ හැකිය.

අ77. කාර්යය මට්ටමේදී අමතර සම්පත් අවශ්‍ය ද යන්න පිළිබඳ කාර්යයේ නියුතු හවුල්කරුගේ නිශ්චය කිරීම වෘත්තීය විනිශ්චයට අදාළ කරුණක් වන අතර, එයට මෙම ශ්‍රීලංවිප්‍ර අවශ්‍යතා සහ විගණන කටයුතුවල ස්වභාවය සහ තත්ත්වයන් මත බලපායි. අ11 ඡේදයේ විස්තර කර ඇති පරිදි, ඇතැම් අවස්ථාවන්හිදී, කාර්යයේ නියුතු

[38] ශ්‍රීලංවිප්‍ර 300 , 9 ඡේදය බලන්න.

කණ්ඩායමට පවරා ඇති හෝ ලබා දී ඇති ඇතැම් සම්පත් ප්‍රමාණවත් නොවීම ඇතුළුව විශේෂිත කාර්යය සංදර්භය තුළ ගුණාත්මක අවදානම් සඳහා සමාගමේ ප්‍රතිචාර අකාර්යක්ෂම බව කාර්යයේ නියුතු හවුල්කරු තීරණය කළ හැකිය. එම තත්ත්වයන් තුළ, 27 ඡේදය සහ 39(ඇ) ඡේදය අනුව එවැනි තොරතුරු සුදුසු පුද්ගලයින්ට සන්නිවේදනය කිරීම ඇතුළුව කාර්යයේ නියුතු හවුල්කරුට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස, සමාගම විසින් සපයනු ලබන විගණන මෘදුකාංග වැඩසටහනකට මෑතක දී නිකුත් කරන ලද කර්මාන්ත නියාමනයට අදාළ වූ නව හෝ සංශෝධිත විගණන ක්‍රියාපටිපාටි ඇතුළත් කර නොමැති නම්, සමාගමට එවැනි තොරතුරු කාලෝචිත ලෙස සන්නිවේදනය කිරීමෙන් මෘදුකාංගය ඉක්මනින් යාවත්කාලීන කිරීමට සහ නැවත නිකුත් කිරීමට හෝ විකල්ප සම්පත් සැපයීමට පියවර ගැනීමට සමාගමට හැකියාව ලැබෙන අතර, එයින් විගණන කාර්යය සාධනයේ දී නව රෙගුලාසි වලට අනුකූල වීමට කාර්යයේ නියුතු කණ්ඩායමට හැකියාව ලබා දෙයි.

අ78. පවරන ලද හෝ ලබා දී ඇති සම්පත් ප්‍රමාණවත් නොවේනම් හෝ නියැලීමේ තත්ත්වයන් තුල නුසුදුසු නම් සහ අතිරේක විකල්ප සම්පත් ලබා දී නොමැති නම් පහත පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය:

- මෙහෙයවීමේ, අධීක්ෂණයේ සහ සමාලෝචනයේ කාලය සහ ප්‍රමාණය පිළිබඳ සැලසුම් කළ ප්‍රවේශය වෙනස් කිරීම (අ94 ඡේදය ද බලන්න),
- අදාල නීතිය හෝ රෙගුලාසි යටතේ දිගුවක් සිදු කළ හැකි විට, කළමනාකාරිත්වය හෝ පාලනය භාරව සිටින අය සමග වාර්තා කිරීමේ කාලසීමාවන්හි දිගුවක් පිළිබඳව සාකච්ඡා කිරීම;
- කාර්යයේ නියුතු හවුල්කරු විගණන කාර්යය සඳහා අවශ්‍ය සම්පත් ලබා නොගන්නේ නම්, මතභේද විසඳීම සඳහා සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම;
- අදාල නීතිය හෝ රෙගුලාසි යටතේ ඉවත්වීම කළහැකි විට, විගණන කාර්යයෙන් ඉවත්වීම සඳහා සමාගමේ ප්‍රතිපත්තිය හෝ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.

*රාජ්‍ය අංශයේ අස්තිත්ත්ව සඳහා විශේෂිත වූ සළකා බැලීම්* (යොමුව: 25 - 28 ඡේද)

අ79. රාජ්‍ය අංශය තුළ, යම් අධිකරණ බලප්‍රදේශයක විගණන විධානයෙහි නියමයන් ඉටු කිරීමට විශේෂිත කුසලතා අවශ්‍ය විය හැකිය. ව්‍යවස්ථාදායකයට හෝ වෙනත් පාලක මණ්ඩලයකට වාර්තා කිරීම හෝ මහජන යහපත පිණිස වාර්තා කිරීම ඇතුළුව, එවැනි කුසලතාවලට අදාළ වාර්තාකරන විධිවිධාන පිළිබඳ අවබෝධයක් ඇතුළත් විය හැකිය. රාජ්‍ය අංශයේ විගණනයක පුළුල් විෂය පථයට උදාහරණයක් ලෙස, කාර්ය සාධන විගණනයේ සමහර අංග ඇතුළත් විය හැක.

**කාර්යයෙහි කාර්ය සාධනය**

*පරිමාණය* (යොමුව: 29 ඡේදය)

අ80. කාර්යයේ නියුතු හවුල්කරු විසින් විගණනයක් සම්පූර්ණයෙන්ම සිදු නොකරන විට හෝ ස්වභාවය සහ තත්ත්වයන් වඩාත් සංකීර්ණ වූ ආයතනයක විගණනයකදී කාර්යයේ නියුතු හවුල්කරුට මඟ පෙන්වීම, අධීක්ෂණය සහ සමාලෝචන කටයුතු කාර්යයේ නියුතු කණ්ඩායමේ වෙනත් සාමාජිකයින්ට පැවරීමට අවශ්‍ය විය හැකිය. කෙසේ වෙතත්, කාර්යයේ නියුතු හවුල්කරුගේ සමස්ත වගකීමේ කොටසක් ලෙස විගණන කාර්යයෙහි ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සහ ප්‍රමාණවත් ලෙස හා නිසි ලෙස සම්බන්ධ වීම 30 ඡේදයට අනුකූලව මෙහෙයවීම, අධීක්ෂණය සමාලෝචනය කිරීමේ ස්වභාවය, කාලය සහ ප්‍රමාණය තීරණය කිරීමට කාර්යයේ නියුතු හවුල්කරුට අවශ්‍ය වේ. එවැනි තත්ත්වයන් තුළ 30 වන ඡේදයට අනුව අවශ්‍ය වන තීරණ ගැනීමට කාර්යයේ නියුතු හවුල්කරුට හැකියාව ලබාදීම සඳහා සංරචක විගණකවරුන් ඇතුළු කාර්යයේ නියුතු කණ්ඩායමේ පිරිස් හෝ සාමාජිකයින් විසින් කාර්යයේ නියුතු හවුල්කරුට තොරතුරු සැපයිය හැකිය.

*මෙහෙයවීම, අධීක්ෂණය සහ සමාලෝචනය* (යොමුව: 30 ඡේදය)

අ81. SLSQM 1 යටතේ, කාර්යයෙහි නියුතු කණ්ඩායම්වල මෙහෙයවීම හා අධීක්ෂණය සහ ඔවුන්ගේ වැඩකටයුතු සමාලෝචනය කිරීමේ ස්වභාවය, කාලය සහ ප්‍රමාණය ආමන්ත්‍රණය කරන ගුණාත්මක අරමුණක් ස්ථාපිත කිරීමට සමාගමට අවශ්‍ය වේ. SLSQM 1 ට අනුව එවැනි මගපෙන්වීමක්, අධීක්ෂණයක් සහ සමාලෝචනයක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන්නේ, කාර්යයේ නියුතු කණ්ඩායමේ අඩු පළ පුරුදු සාමාජිකයින් විසින් ඉටු කරන ලද කාර්යයන් වඩාත් පළපුරුදු කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් විසින් මෙහෙයවීම, අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම යන පදනම මතය.

අ82. කාර්යයේ මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන, කාර්යයේ නියුතු කණ්ඩායමේ මග පෙන්වීම හා අධීක්ෂණය සහ කාර්යයේ නියුතු කණ්ඩායමේ වැඩ සමාලෝචනය එහි ස්වභාවය, කාලය හා ප්‍රමාණය විගණන කාර්යයෙහි ගුණාත්මකභාවය කළමනාකරණය කිරීමේදී කාර්යයේ නියුතු හවුල්කරුට සමාගම් මට්ටමේ ප්‍රතිචාර අනුව තවදුරටත් සකස් කළ හැකිය. ඒ අනුව, කාර්යයෙහි ස්වභාවය සහ තත්ත්වයන් සැළකිල්ලට ගනිමින්, මග පෙන්වීම, අධීක්ෂණය හා සමාලෝචනය සඳහා වන ප්‍රවේශය එක් කාර්යයකින් ඊළඟ කාර්යයට වෙනස්වේ. ප්‍රවේශයට සාමාන්‍යයෙන් සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි සහ කාර්යයෙහි විශේෂිත ප්‍රතිචාර එකතුවක් ආමන්ත්‍රණය කිරීම ඇතුළත් වේ.

අ83. කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ගේ මඟපෙන්වීම සහ අධීක්ෂණය හා ඔවුන්ගේ වැඩ කටයුතු සමාලෝචනය සඳහා වූ ප්‍රවේශය මෙම ශ්‍රීලංවිප්‍රහි අවශ්‍යතා සපුරාලීම සඳහා කාර්යයේ නියුතු හවුල්කරුට සහාය සපයන අතර, 40 වන ඡේදයට අනුකූලව විගණන කාර්යය පුරාවට කාර්යයේ නියුතු හවුල්කරු ප්‍රමාණවත් ලෙස සහ සුදුසු ලෙස සම්බන්ධ වී ඇති බවට නිගමනය කරයි.

අ84. කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් අතර අඛණ්ඩ සාකච්ඡාව සහ සන්නිවේදනය මගින් කාර්යයේ නියුතු කණ්ඩායමේ අඩු පළපුරුද්දකින් යුත් සාමාජිකයින්ට, කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩා පළ පුරුදු සාමාජිකයින්ගෙන් ප්‍රශ්න මතුකිරීමට ඉඩ සැලසීමෙන් (කාර්යයේ නියුතු හවුල්කරු ඇතුළුව) කාලෝචිත ආකාරයකින් සහ 30 ඡේදයට අනුව ඵලදායී මඟපෙන්වීම, අධීක්ෂණය සහ සමාලෝචනය සක්‍රීය කෙරේ.

මෙහෙයවීම

අ85. කාර්යයේ නියුතු කණ්ඩායමේ මගපෙන්වීමට, කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ට ඔවුන්ගේ වගකීම පිළිබඳව දැනුම්දීම ඇතුළත් විය හැකිය. එනම්:

- ඔවුන්ගේ පුද්ගලික හැසිරීම්, සන්නිවේදනය සහ ක්‍රියාවන් හරහා කාර්යයේ මට්ටමින් තත්ත්ව කළමනාකරණය සහ සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වීම.
- විගණන සාක්ෂි එකතු කිරීමේදී සහ ඇගයීමේදී ප්‍රශ්න කරන මනසක් පවත්වා ගැනීම සහ වෘත්තීය සංශය භාවය ක්‍රියාත්මක කිරීමේදී අවිඥානික හෝ සවිඥානිකයන් විගණක පක්ෂග්‍රාහීත්වය පිළිබඳව දැනුවත් වීම. (අ35 ඡේදය බලන්න).
- අදාල ආචාර ධර්ම අවශ්‍යතා සපුරාලීම
- විගණනය කාර්යයක් පැවැත්වීම සඳහා එක් හවුල්කරුවෙකුට වඩා සම්බන්ධ වන විට අදාළ හවුල්කරුවන්ගේ වගකීම්.
- විගණන ක්‍රියාපටිපාටි සිදු කිරීම සඳහා අදාළ කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ගේ වගකීම් සහ කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩාත් පළපුරුදු සාමාජිකයින් විසින් කාර්යයේ නියුතු කණ්ඩායමේ අඩු පළ පුරුදු සාමාජිකයින්ගේ වැඩකටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා සමාලෝචනය කිරීම.
- සමස්ත විගණන උපාය මාර්ගයේ හා විගණන සැලැස්මේ දක්වා ඇති පරිදි, සැලසුම් කළ විගණන ක්‍රියාපටිපාටි වල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය පිළිබඳ සවිස්තරාත්මක උපදෙස් සහ ඉටුකළ යුතු කාර්යයේ අරමුණු අවබෝධ කරගැනීම.
- ගුණාත්මකභාවය සාක්ෂාත් කර ගැනීමට ඇති තර්ජන ආමන්ත්‍රණය කිරීම සහ කාර්යයේ නියුතු කණ්ඩායමේ අපේක්ෂිත ප්‍රතිචාරය. උදාහරණ වශයෙන්, අයවැය සීමාවන් හෝ සම්පත් සීමාවන් නිසා කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් සැලසුම් කල විගණන ක්‍රියාපටිපාටි වෙනස් කිරීමට හෝ සැලසුම් කල විගණන ක්‍රියාපටිපාටි ඉටුකිරීමට අපොහොසත් වීමට හේතු නොවිය යුතුය.

අධීක්ෂණය

අ86. අධීක්ෂණයට පහත කරුණු ඇතුළත් විය හැකිය:

- අධීක්ෂණය ඇතුළත් විගණන කාර්යයෙහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම;
    - විගණන සැලැස්මට එරෙහිව ප්‍රගතිය;

   ○ ඉටුකරන ලද කාර්යයේ අරමුණු සාක්ෂාත් කරගෙන තිබේද; සහ
   ○ පවරා ඇති සම්පත්වල පවතින ප්‍රමාණවත් බව.

- කාර්යය අතරතුරදී පැන නගින ගැටළු විසඳීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. උදාහරණයක් ලෙස, ගැටළු මුලින් බලාපොරොත්තු වූවාට වඩා සංකීර්ණ වූ විට, සැලසුම්ගත විගණන ක්‍රියාපටිපාටි කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩාත් පළපුරුදු සාමාජිකයින් වෙත නැවත පැවරීම.

- විගණන කාර්යය අතරතුර කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩාත් පළපුරුදු සාමාජිකයන් විසින් උපදේශනය හෝ සළකා බැලීම සඳහා කරුණු හඳුනා ගැනීම.

- කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ගේ කුසලතා හෝ නිපුණතා වර්ධනය කිරීමට උපකාර කිරීම සඳහා පුහුණු කිරීම සහ රැකියා ස්ථානයේ පුහුණුව ලබාදීම.

- කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් පළිගැනීම් වලට බිය නොවී ගැටළු මතු කරන පරිසරයක් නිර්මාණය කිරීම.

සමාලෝචනය

අ87. මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා ආමන්ත්‍රණය කර ඇති බවට නිගමනය කිරීමට කාර්යයේ නියුතු කණ්ඩායමේ වැඩ කටයුතු සමාලෝචනය සහාය වෙයි.

අ88. කාර්යයේ නියුතු කණ්ඩායමේ වැඩකටයුතු පිළිබඳ සමාලෝචනය සමන්විත වන්නේ, උදාහරණයක් ලෙස;

- අස්තිත්ත්වයේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි, වෘත්තීය ප්‍රමිතීන් සහ අදාල නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුකුලව වැඩ කටයුතු සිදුකර ඇත;
- තවදුරටත් සළකා බැලීම සඳහා වැදගත් කරුණු මතු කර ඇත;
- සුදුසු උපදේශන සිදුකර ඇති අතර, ප්‍රතිඵලය වූ නිගමන ලේඛනගත කර ක්‍රියාත්මක කර ඇත;
- ඉටුකරන ලද වැඩකටයුතු වල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී;
- ඉටු කරන ලද වැඩ කටයුතු එළඹි නිගමනවලට සහාය වන අතර, සුදුසු පරිදි ලේඛනගත කර ඇත;
- ලබාගත් සාක්ෂි විගණකගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් වීම සහ සුදුසු වීම; සහ
- විගණන ක්‍රියාපටිපාටිවල අරමුණු සාක්ෂාත් කරගෙන ඇත.

අ89. සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි වල පහත දැක්වෙන විශේෂිත අවශ්‍යතා අඩංගු විය හැක:

- විගණන ලියකියවිලි සමාලෝචනයේ ස්වභාවය, කාලය සහ ප්‍රමාණය;
- විවිධ අවස්ථාවන්ට යෝග්‍ය විය හැකි විවිධ ආකාරයේ සමාලෝචන (උදා: එක් එක් වැඩ පත්‍රිකා හෝ තෝරාගත් වැඩ පත්‍රිකා සමාලෝචනය කිරීම); සහ
- විවිධ ආකාරයේ සමාලෝචන සිදු කිරීමට අවශ්‍ය වන්නේ කාර්යයේ නියුතු කණ්ඩායමේ කුමන සාමාජිකයින්ද යන්න.

කාර්යයේ නියුතු හවුල්කරුගේ සමාලෝචනය (යොමුව: 30 - 34 ඡේද)

අ90. ශ්‍රීලංවිප්‍ර 230 හි අවශ්‍යතා පරිදි කාර්යයේ නියුතු හවුල්කරු සමාලෝචනයේ දිනය හා ප්‍රමාණය ලේඛණගත කරයි.[39]

[39] ශ්‍රීලංවිප්‍ර - 230, 9(ඇ) ඡේදය

අ91. විගණන කාර්යය පුරාවටම සුදුසු අදියරයන්හිදී කාර්යයේ නියුතු හවුල්කරු විසින් ලේඛනගත කිරීම් කාලෝචිත ලෙස සමාලෝචනය කිරීමෙන් විගණකගේ වාර්තාවේ දිනට හෝ ඊට පෙර කාර්යයේ නියුතු හවුල්කරුගේ තෘප්තිය සඳහා සැළකිය යුතු කරුණු විසඳා ගැනීමට හැකිවේ. කාර්යයේ නියුතු හවුල්කරු විසින් සියළු විගණන ලේඛන සමාලෝචනය කිරීම අවශ්‍ය නොවේ.

අ92. කාර්යයේ නියුතු කණ්ඩායම විසින් සැළකිය යුතු විනිශ්චයන් සිදුකරන ලද ක්ෂේත්‍ර හඳුනාගැනීමේ දී කාර්යයේ නියුතු හවුල්කරු වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරයි. සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි සැළකිය යුතු විනිශ්චයන් ලෙස පොදුවේ අපේක්ෂා කෙරෙන ඇතැම් කරුණු සඳහන් කළ හැකිය. විගණන කාර්යට අදාළව සැළකිය යුතු විනිශ්චයන් කාර්යය භාර ගැනීම සඳහා වූ සමස්ත විගණන උපාය මාර්ගයට සහ විගණන සැලැස්මට අදාළ කරුණුවල ඇතුළත් විය හැකිය. කාර්යය ක්‍රියාත්මක කිරීම සහ කාර්යයේ නියුතු කණ්ඩායම විසින් එළඹ ඇති සමස්ත නිගමන, උදාහරණයක් ලෙසඃ

- ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීමට සම්බන්ධ කාරණා වැනි කාර්යය සැලසුම් කිරීමට අදාළ කරුණු.
- කාර්යයේ නියුතු කණ්ඩායමේ පහත පරිදි වූ සංයුතියඃ
  - ගිණුම්කරණය හෝ විගණනය පිළිබඳ විශේෂිත ක්ෂේත්‍රයක දැනුම භාවිතා කරන පිරිස්;
  - සේවා බෙදා හැරීමේ මධ්‍යස්ථානවලින් පිරිස් භාවිතා කිරීම.
- බාහිර විශේෂඥයෙකු සම්බන්ධ කරගැනීමේ තීරණය ඇතුළුව විගණකගේ විශේෂඥයෙකු සම්බන්ධ කරගැනීමේ තීරණය.
- පිළිගැනීමේ හා අඛන්ඩ ක්‍රියාවලියේදී ලබාගත් තොරතුරු සහ එම තොරතුරු සඳහා යෝජිත ප්‍රතිචාර පිළිබඳ කාර්යයේ නියුතු කණ්ඩායමේ සළකා බැලීම.
- ආවේණික අවදානම් සාධක සලකා බැලීම සහ ආවේණික අවදානම තක්සේරු කිරීම සඳහා කාර්යයේ නියුතු කණ්ඩායම විසින් සැළකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වන අවස්ථා ඇතුළුව කාර්යයේ නියුතු කණ්ඩායමේ අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය.
- සම්බන්ධිත පාර්ශව සම්බන්ධතා සහ ගණුදෙනු සහ හෙළිදරව් කිරීම් පිළිබඳ කාර්යයේ නියුතු කණ්ඩායමේ සළකා බැලීම.
- කාර්යයේ නියුතු කණ්ඩායම විසින් කාර්යයේ සැළකිය යුතු ක්ෂේත්‍රවල සිදුකරන ලද ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵල උදාහරණයක් ලෙස, ඇතැම් ගිණුම්කරණ ඇස්තමේන්තු, ගිණුම්කළ ප්‍රතිපත්ති හෝ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ නිගමන.
- විශේෂඥයින් විසින් ඉටු කරන ලද කාර්යය පිළිබඳ කාර්යයේ නියුතු කණ්ඩායමේ ඇගයීම සහ එයින් ලබාගත් නිගමන.
- සමූහ විගණන අවස්ථාවන්හිදීඃ
  - යෝජිත සමස්ත සමූහ විගණන උපායමාර්ගය සහ සමූහ විගණන සැලැස්ම;
  - සංරචක විගණකවරුන්ගේ මැදිහත්වීම පිළිබඳ තීරණ, ඔවුන් මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සහ ඔවුන්ගේ වැඩ කටයුතු සමාලෝචනය කිරීම ඇතුළුව උදාහරණයක් ලෙස, සංරචකයක මූල්‍ය තොරතුරු වල ප්‍රමාණාත්මක අව ප්‍රකාශවල ඉහළ තක්සේරු අවදානමක් ඇති ක්ෂේත්‍ර ඇති විට; සහ
  - සංරචක විගණකවරුන් විසින් ඉටු කරන ලද වැඩ කටයුතු ඇගයීම හා එයින් ලබා ගන්නා නිගමන.
- සමස්ත විගණන උපාය මාර්ගයට සහ විගණන සැලැස්මට බලපාන කරුණු ආමන්ත්‍රණය කර ඇති ආකාරය.
- කාර්යය ඉටු කරන අතරතුර හඳුනාගත් නිවැරදි කරන ලද සහ නිවැරදි නොකළ අව ප්‍රකාශවල වැදගත්කම සහ බැහැර කිරීම.

- යෝජිත විගණන මතය සහ විගණකගේ වාර්තාවේ සන්නිවේදනය කළ යුතු කරුණු, උදාහරණයක් ලෙස, ප්‍රධාන විගණන කරුණු හෝ "අඛණ්ඩ පැවැත්ම හා සම්බන්ධිත ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවය" ඡේදයක්.

අ93. කාර්යයේ නියුතු හවුල්කරු වෙනත් කරුණු සමාලෝචනය කිරීමට තීරණය කිරීමේ දී වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරයි, උදාහරණයක් ලෙස:

- විගණන කාර්යයේ ස්වභාවය සහ තත්ත්වයන්
- කාර්යයේ නියුතු කණ්ඩායමේ කුමන සාමාජිකයා විසින් කාර්යය ඉටු කළේ ද යන්න.
- කාලීන පරීක්ෂණ වල සොයා ගැනීම් සම්බන්ධ කරුණු
- සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවල අවශ්‍යතා

ස්වභාවය, කාලය සහ ප්‍රමාණය

අ94. සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට මෙන්ම වෘත්තීය ප්‍රමිතීන් සහ අදාල නීතිමය සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව මෙහෙය වීමේ, අධීක්ෂණයේ සහ සමාලෝචනයේ ස්වභාවය, කාලය හා ප්‍රමාණය සැලසුම්කර ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස, සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවලට පහත කරුණු ඇතුළත් විය හැකිය:

- කාල පරිච්ඡේදය අවසානයේදී නොව, ක්‍රියාපටිපාටිවල කාර්ය සාධනය සමගම අතුරුදිනයක සිදු කිරීමට සැලසුම් කර ඇති මෙහෙයවීම, අධීක්ෂණය හා සමාලෝචනය කිරීමෙන් අවශ්‍ය ඕනෑම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් නියමිත වේලාවට ගත හැකිය.

- කාර්යයේ නියුතු හවුල්කරු විසින් ඇතැම් කරුණු සමාලෝචනය කළ යුතු අතර, සමාලෝචනය කිරීමට අපේක්ෂා කරන කරුණු පිළිබඳව සමාගම විසින් තත්ත්වයන් හෝ බැඳීම් නියම කළ හැක.

පරිමාණය

අ95. මග පෙන්වීම, අධීක්ෂණය සහ සමාලෝචනය සඳහා වූ ප්‍රවේශය පහත කරුණු මත සකස් කළ හැකිය, උදාහරණයක් වශයෙන්:

- විගණනය කළ යුතු අස්තිත්ත්වය සහ විගණනය කළ යුතු කොටස් පිළිබඳව කාර්යයේ නියුතු සාමාජිකයින්ගේ පෙර අත්දැකීම්. උදාහරණ වශයෙන්, අස්තිත්ත්වයේ තොරතුරු පද්ධතියට අදාළ වැඩ කොටස් ඉටු කරනු ලබන්නේ පෙර කාලසීමාව තුළ එම වැඩ කොටස් ඉටුකළ කාර්යයේ නියුතු කණ්ඩායමේ එම සාමාජිකයා විසින් නම් සහ තොරතුරු පද්ධතියෙහි සැලකිය යුතු වෙනස්කම් නොමැති නම් කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයාගේ හා මෙහෙයවීමේ සහ අධීක්ෂණයේ ප්‍රමාණය සහ සංඛ්‍යාතය අඩු විය හැකි අතර, අදාළ වැඩ පත්‍රිකා සමාලෝචනය අඩු විස්තර සහිත විය හැක.

- විගණන කාර්යයේ සංකීර්ණත්වය. උදාහරණයක් ලෙස, විගණන කාර්යය වඩාත් සංකීර්ණ වන වැදගත් සිදුවීම් සිදුව ඇත්නම්, කාර්යයේ නියුතු කණ්ඩායමේ මෙහෙයවීමේ සහ අධීක්ෂණයේ ප්‍රමාණය සහ සංඛ්‍යාතය වැඩි විය හැකි අතර, අදාළ වැඩ පත්‍රිකා සමාලෝචනය වඩාත් සවිස්තරාත්මක විය හැක.

- ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයේ තක්සේරු අවදානම්. උදාහරණයක් ලෙස, ප්‍රමාණාත්මක අප්‍රකාශයේ ඉහළ තක්සේරු අවදානමක් සඳහා කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ගේ මෙහෙයවීම සහ අධීක්ෂණය හා ඔවුන්ගේ වැඩ පිළිබඳ වඩාත් සවිස්තරාත්මක සමාලෝචනයක ප්‍රමාණය සහ සංඛ්‍යාතයේ අනුරූප වැඩිවීමක් අවශ්‍ය විය හැක.

- විගණන කාර්යය ඉටු කරන කාර්යයෙහි නියුතු කණ්ඩායමේ තනි පුද්ගල සාමාජිකයින්ගේ නිපුණතාවය හා හැකියාවන්. උදාහරණයක් ලෙස, කාර්යයේ නියුතු කණ්ඩායමේ අඩු පළපුරුදු සාමාජිකයින්ට වඩාත් සවිස්තරාත්මක උපදෙස් අවශ්‍ය විය හැකි අතර, කාර්යය සිදුකරන විට නිතර නිතර හෝ පුද්ගලිකව අන්තර් ක්‍රියා අවශ්‍ය විය හැක.

- ඉටුකරන ලද කාර්යයේ සමාලෝචනය සිදු කිරීමට අපේක්ෂා කරන ආකාරය. උදාහරණ වශයෙන්, සමහර

තත්ත්වයන් තුළ, අවශ්‍ය මග පෙන්වීම් දුරස්ථ සමාලෝචන මගින් සැපයීමේදී ඵලදායී නොවිය හැකි අතර, පුද්ගල අන්තර් ක්‍රියා මගින් පරිපූර්ණය කිරීමට අවශ්‍ය විය හැකිය.

- කාර්යයේ නියුතු කණ්ඩායමේ ව්‍යුහය හා කාර්යයේ නියුතු කණ්ඩායමේ ස්ථානගත වීම. උදාහරණයක් ලෙස, සේවා මධ්‍යස්ථානවල සිටින පුද්ගලයින්ගේ මඟ පෙන්වීම සහ අධීක්ෂණය හා ඔවුන්ගේ වැඩ කටයුතු සමාලෝචනය කළ හැක්කේ :
  - ○ කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් සියලු දෙනාම එකම ස්ථානයක සිටිනවාට වඩා විධිමත් හා ව්‍යුහ ගත වීම; හෝ
  - ○ කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් අතර සන්නිවේදනය පහසු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම.

අ96. කාර්යයෙහි අවස්ථාවල වෙනස්කම් හඳුනා ගැනීම, මෙහෙයවීමේ ස්වභාවය, කාලය හෝ ප්‍රමාණය අධීක්ෂණය හෝ සමාලෝචනය සඳහා සැලසුම් කළ ප්‍රවේශය නැවත ඇගයීමට ලක් කළ හැකිය. උදාහරණයක් වශයෙන්, සංකීර්ණ ගනුදෙනුවක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන මට්ටමින් ප්‍රමාණවත් අව ප්‍රකාශයේ තක්සේරු අවදානම වැඩි වුවහොත්, ගනුදෙනුවට සම්බන්ධ කාර්යයෙහි සැලසුම්ගත සමාලෝචන මට්ටම වෙනස් කිරීමට හවුල්කරුට අවශ්‍ය විය හැක.

අ97 30(අ) ඡේදයට අනුකූලව, විගණන කටයුතුවල ස්වභාවය සහ තත්ත්වයන් අනුව මගපෙන්වීම අධීක්ෂණය සහ සමාලෝචනය සඳහා වූ ප්‍රතිචාරාත්මක ප්‍රවේශය තීරණය කිරීමට කාර්යයේ නියුතු හවුල්කරුට අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස, කාර්යයේ නියුතු කණ්ඩායමේ අධීක්ෂණයට සහ සමාලෝචනයට සහභාගි වීම සඳහා කාර්යයේ නියුතු කණ්ඩායමේ වඩා පළපුරුදු සාමාජිකයෙකු නොමැති නම්, කාර්යයේ නියුතු හවුල්කරුට කාර්යයේ නියුතු කණ්ඩායමේ අඩු පළපුරුදු සාමාජිකයින්ගේ අධීක්ෂණයේ සහ සමාලෝචනයේ ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය විය හැක.

පාලනය භාරව සිටින කළමනාකරණය හෝ නියාමන අධිකාරීන් වෙත සමාලෝචනය පිළිබඳ සන්නිවේදනය (යොමුව: 34 ඡේදය)

අ98. විගණන කාර්යයේ ස්වභාවය සහ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, සමාලෝචනය කළ යුතු ලිඛිත සන්නිවේදනයන් තීරණය කිරීමේ දී කාර්යයේ නියුතු හවුල්කරු වෘත්තීය විනිශ්චය භාවිතා කරයි. උදාහරණයක් ලෙස, විගණනයේ සාමාන්‍ය අවස්ථාවන්හිදී කාර්යයේ නියුතු කණ්ඩායම සහ කළමනාකාරිත්වය අතර සන්නිවේදනයන් සමාලෝචනය කිරීමට කාර්යයේ නියුතු හවුල්කරුට අවශ්‍ය නොවනු ඇත.

*උපදේශනය* (යොමුව: 35 ඡේදය)

අ99. SLSQM 1 අවශ්‍යතා පරිදි සමාගම විසින් දුෂ්කර හෝ මතභේදාත්මක කරුණු සහ එකඟ වූ නිගමන ක්‍රියාවට නංවන ආකාරය පිළිබඳ උපදේශන ආමන්ත්‍රණය කරන ගුණාත්මක අරමුණක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. උපදේශනය යෝග්‍ය හෝ අවශ්‍ය විය හැකිය, උදාහරණයක් ලෙසඃ

- සංකීර්ණ හෝ නුහුරු ගැටළු (උදාඃ ඉහළ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයක් සහිත ගිණුම්කරණ ඇස්තමේන්තුවකට අදාළ ගැටළු);
- සැළකිය යුතු අවදානම්;
- අස්තිත්ත්වයෙහි සාමාන්‍ය ව්‍යාපාර මාර්ගයෙන් බැහැර වූ හෝ වෙනත් ආකාරයකින් අසාමාන්‍ය ලෙස පෙනෙන සැළකිය යුතු ගණුදෙනු;
- කළමනාකරණය විසින් පනවන ලද සීමාවන්; සහ
- නීති හෝ රෙගුලාසි වලට අනුකූල නොවීම.

අ100. සමාගම තුළ සැළකිය යුතු තාක්ෂණික, ආචාර ධාර්මය සහ වෙනත් කරුණු පිළිබඳ ඵලදායී උපදේශනය හෝ අදාළ වන විට, සමාගමට පිටතින් උපදේශන ලබා දුන් විට පහත කරුණු සාක්ෂාත් කරගත හැකිය.

- අදාළ සියළු කරුණු ලබාදීම මගින් ඔවුන්ට දැනුවත් උපදෙස් ලබාදීමට හැකිවනු ඇත; සහ

- යෝග්‍ය දැනුම, ජ්‍යෙෂ්ඨත්වය සහ පළපුරුද්ද තිබීම.

අ101. සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටිවල සන්දර්භය තුළ, කාර්යයේ නියුතු කණ්ඩායමට සමාගමට පිටතින් උපදෙස් ලබා ගැනීම සුදුසු විය හැකිය, උදාහරණයක් ලෙස, සමාගමට සුදුසු අභ්‍යන්තර සම්පත් නොමැති වීම. අදාල තත්ත්ව පාලන සේවා සපයන සමාගම්, වෘත්තීය සහ නියාමන ආයතන හෝ වාණිජ සංවිධාන විසින් සපයනු ලබන උපදේශන සේවාවලින් කාර්යයේ නියුතු කණ්ඩායමට ප්‍රයෝජන ගත හැකිය.

අ102. දුෂ්කර හෝ මතභේදාත්මක කාරණයක් සම්බන්ධයෙන් කාර්යයෙන් පිටත උපදේශයේ අවශ්‍යතාවය එම කාරණය විගණන කරුණක් වූ බවට දර්ශකයක් විය හැකිය.[40]

*කාර්යයේ තත්ත්ව සමාලෝචනය* (*යොමුව:* 36 *ඡේදය*)

අ103. SLSQM 2 [41] ට අනුකූලව SLSQM 1 හි කාර්යයෙහි ගුණාත්මක සමාලෝචන ආමන්ත්‍රණය කිරීමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරීමේ අවශ්‍යතා අඩංගු වන අතර, ඇතැම් ආකාරයේ කාර්යයන් සඳහා කාර්යයෙහි ගුණාත්මක තත්ත්ව සමාලෝචනයක් අවශ්‍ය වේ.[42] SLSQM 2 මගින් කාර්යයෙහි තත්ත්ව සමාලෝචකයාගේ පත්වීම සහ සුදුසුකම් පිළිබඳව සහ කාර්යයෙහි ගුණාත්මක සමාලෝචනයක් සිදුකිරීම හා ලේඛනගත කිරීම සම්බන්ධව කාර්යයෙහි තත්ත්ව සමාලෝචකයාගේ වගකීම් පිළිබඳව කටයුතු කරයි.

විගණකගේ වාර්තාව දාතම් කිරීමට පෙර කාර්යයෙහි තත්ත්ව සමාලෝචනය සම්පූර්ණ කිරීම (යොමුවː 36(ඈ) ඡේදය)

අ104. ශ්‍රීලංවිප්‍ර 700 (සංශෝධිත) හි අවශ්‍යතා පරිදි මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ මතය පදනම් කර ගැනීම මත විගණකවරයාගේ වාර්තාව ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබාගෙන ඇති දිනට වඩා කලින් දාතම් කිරීම අවශ්‍ය වේ.[43] විගණන කාර්යයට ව්‍යවහාර කරන්නේ නම්, SLSQM 2 සහ මෙම ශ්‍රීලංවිප්‍ර න් අවශ්‍ය වන්නේ කාර්යයෙහි තත්ත්ව සමාලෝචනය අවසන් වූ බවට කාර්යයෙහි තත්ත්ව සමාලෝචක ගෙන් දැනුම් දීමක් ලැබෙන තුරු කාර්යයේ නියුතු හවුල්කරු විසින් කාර්යයෙහි වාර්තාව විසින් දාතම් කිරීමෙන් වැළකිය යුතු බවයි. උදාහරණයක් ලෙස, කාර්යයෙහි ගුණාත්මක සමාලෝචකයා විසින් කාර්යයෙහි නියුතු හවුල්කරුට, කාර්යයෙහි නියුතු කණ්ඩායම විසින් සිදු කරන ලද සැළකිය යුතු විනිශ්චයන් හෝ ඒ මත එළඹුණු නිගමන යෝග්‍ය නොවන බව ගැන සැළකිලිමත් වීම පිළිබඳව සන්නිවේදනය කර ඇත්නම්, එවිට කාර්යයෙහි තත්ත්ව සමාලෝචනය සම්පූර්ණ නොවේ. [44]

අ105. විගණන කාර්යයක නියමිත අවස්ථාවලදී කාලෝචිත ආකාරයකින් පවත්වනු ලබන කාර්යයෙහි තත්ත්ව සමාලෝචනයකින්, විගණකගේ වාර්තාවේ දිනට හෝ ඊට පෙර කාර්යයෙහි තත්ත්ව සමාලෝචකයා සෑහීමට පත්වන කරුණු කඩිනමින් විසඳීමට කාර්යයෙහි නියුතු කණ්ඩායමට සහාය විය හැක.

අ106. කාර්යයේ නියුතු කන්ඩායම සහ කාර්යයෙහි ගුණාත්මක සමාලෝචකයා අතර සිදුවන නිරන්තර සන්නිවේදනයන් මගින් විගණන කාර්යය පුරාවටම ඵලදායි සහ කාලෝචිත කාර්යයෙහි තත්ත්ව සමාලෝචනයකට පහසුකම් සැලසීමට සහාය විය හැක. කාර්යයෙහි තත්ත්ව සමාලෝචක සමඟ සැළකිය යුතු කරුණු සාකච්ඡා කිරීමට අමතරව, කාර්යයෙහි ගුණාත්මක සමාලෝචකගේ ඉල්ලීම සම්බන්ධීකරණය කිරීමේ වගකීම කාර්යයේ නියුතු හවුල්කරු විසින් කාර්යයෙහි නියුතු කණ්ඩායමේ වෙනත් සාමාජිකයකුට පැවරිය හැක.

*මතයේ වෙනස්කම්* (යොමුවː 37 - 38 ඡේද)

අ107. SLSQM 1 හි අවශ්‍යතා පරිදි, සමාගම කාර්යයේ නියුතු කණ්ඩායම තුළ හෝ කාර්යයේ නියුතු කණ්ඩායම සහ කාර්යයෙහි තත්ත්ව සමාලෝචකයා හෝ සමාගමේ තත්ත්ව කළමනාකරන පද්ධතිය තුළ ක්‍රියාකාරකම් සිදුකරන පුද්ගලයින් අතර පැන නගින මතභේද ආමන්ත්‍රණය කරන ගුණාත්මක අරමුණක් ස්ථාපිත කළ

[40] ශ්‍රීලංවිප්‍ර 701, 9 සහ අ14 ඡේද

[41] SLSQM 2, කාර්යයෙහි තත්ත්ව සමාලෝචන

[42] SLSQM 1, 34(ඊ) ඡේදය

[43] ශ්‍රීලංවිප්‍ර 700 (සංශෝධිත) 49 ඡේදය.

[44] SLSQM 2, 26 ඡේදය.

යුතුය. SLSQM 1 හි අවශ්‍යතා පරිදි මතයේ වෙනස්කම් සමාගමේ අවධානයට යොමු කර විසඳා ගැනීමට ද අවශ්‍ය වේ.

අ108. සමහර අවස්ථාවලදී මතයේ වෙනස්කම් නිරාකරණය කිරීම සම්බන්ධයෙන් කාර්යයේ නියුතු හවුල්කරු සෑහීමකට පත් නොවිය හැකිය. එවැනි තත්ත්වයන් තුළ, කාර්යයේ නියුතු හවුල්කරු සඳහා පහත පරිදි වූ සුදුසු ක්‍රියාමාර්ග ඇතුළත් විය හැක:

- නීති උපදෙස් ලබා ගැනීම; හෝ
- අදාල නීතිය හෝ රෙගුලාසි යටතේ ඉවත්වීම කළ හැකි නම්, විගණන කාර්යයෙන් ඉවත්වීම.

**අධීක්ෂණය සහ ප්‍රතිකර්ම** (යොමුව: 39 ඡේදය)

අ109. SLSQM 1, සමාගමේ අධීක්ෂණ සහ ප්‍රතිකර්ම ක්‍රියාවලිය සඳහා අවශ්‍යතා දක්වා ඇත. SLSQM 1 ට අනුව සමාගමට ඔවුන්ගේ වගකීම් අනුව කඩිනම් සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි සමාගමේ අධීක්ෂණ සහ ප්‍රතිකර්ම ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු කාර්යයේ නියුතු කණ්ඩායම වෙත සන්නිවේදනය කිරීම අවශ්‍ය වේ.[45] තවද, කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් විසින් සපයනු ලබන තොරතුරු සමාගමේ අධීක්ෂණ සහ ප්‍රතිකර්ම ක්‍රියාවලියේදී සහ වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සංශයභාවය ක්‍රියාත්මක කිරීමේ දී සමාගම විසින් භාවිතයෙන් විගණනය ඉටු කරන අතරතුර, එම ක්‍රියාවලියට අදාළ විය හැකි තොරතුරු සඳහා අවධානයෙන් සිටීම මඟින් කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් හට සහාය විය හැක.

අ110. සමාගම විසින් සපයන තොරතුරු විගණන කාර්යයට අදාල විය හැක. උදාහරණයක් ලෙස, කාර්යයේ නියුතු හවුල්කරු හෝ කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් විසින් සිදුකරන ලද වෙනත් නියැලීමක් පිළිබඳසොයා ගැනීම්, සමාගමේ දේශීය කාර්යාලයේ සොයා ගැනීම් හෝ අස්තිත්වයේ පෙර විගණනවල පරීක්ෂණ ප්‍රතිඵල වලට අදාළ වන විට ආදී වශයෙනි.

අ111. සමාගම විසින් එහි අධීක්ෂණ සහ ප්‍රතිකර්ම ක්‍රියාවලිය හරහා සන්නිවේදනය කරන ලද තොරතුරු සහ එය විගණන කාර්යයට බලපාන ආකාරය සළකා බැලීමේ දී, කාර්යයේ නියුතු හවුල්කරු විසින් හඳුනාගත් අඩුපාඩු සපුරාලීම සඳහා සමාගම විසින් සැලසුම්කර ක්‍රියාත්මක කරන ලද ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සළකා බැලිය හැකි අතර, කාර්යයේ ස්වභාවය සහ තත්ත්වයට අදාළ ප්‍රමාණයට, කාර්යයේ නියුතු කණ්ඩායමට ඒ අනුව සන්නිවේදනය කළ හැකිය. කාර්යයේ මට්ටමේදී අමතර ක්‍රියාමාර්ග අවශ්‍ය ද යන්න තීරණය කිරීමට ද කාර්යයේ නියුතු හවුල්කරුට හැකිවේ. උදාහරණයක් ලෙස, කාර්යයේ නියුතු හවුල්කරුට පහත කරුණු තීරණය කළ හැකිය.

- විගණකගේ විශේෂඥයෙකු අවශ්‍ය වීම; හෝ
- විගණනයේ අඩුපාඩු හඳුනාගෙන ඇති ක්ෂේත්‍රයක මගපෙන්වීම, අධීක්ෂණය සහ සමාලෝචනයේ ස්වභාවය, කාලය සහ ප්‍රමාණය වැඩිදියුණු කළ යුතු වීම.

හඳුනාගත් අඩුපාඩුවක් විගණනයේ ගුණාත්මකභාවයට බල නොපාන්නේ නම්, (උදා: එය කාර්යයේ නියුතු කණ්ඩායම භාවිතා නොකළ තාක්ෂණික සම්පතකට සම්බන්ධ නම්) එවිට වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවනු ඇත.

අ112. වෘත්තීය ප්‍රමිතීන්ට සහ අදාල නෛතික හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව විගණන සිදු කර නැති බව හෝ තත්ත්වයන් තුළ විගණකගේ වාර්තාව යෝග්‍ය නොවන බව, සමාගමේ තත්ත්ව කළමනාකරණ පද්ධතියේ හඳුනාගත් අඩුපාඩුවක් ලෙස අනිවාර්යයෙන්ම එය නොපෙන්වයි.

[45] SLSQM 1, 47 ඡේදය

**ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සඳහා සමස්ත වගකීම භාර ගැනීම.** (යොමුව: 40 ඡේදය)

අ113. SLSQM 1 ට අනුව, සමාගම විසින් කාර්යය සම්බන්ධයෙන් කාර්යයේ නියුතු කණ්ඩායමේ අවබෝධය සහ ඔවුන්ගේ වගකීම් ඉටුකිරීම ආමන්ත්‍රණය කිරීම සඳහා ගුණාත්මක අරමුණක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. SLSQM 1 ට අනුව තවදුරටත් අවශ්‍ය වන්නේ ගුණාත්මක පරමාර්ථයට කාර්යයේ ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සහ සාක්ෂාත් කර ගැනීම සහ කාර්ය පුරාවට ප්‍රමාණවත් ලෙස සහ උචිත ලෙස සම්බන්ධ වීම සඳහා කාර්යයේ නියුතු හවුල්කරුවන්ගේ වගකීම ඇතුළත් විය යුතු බවයි.

අ114. 40 වන ඡේදය ආමන්ත්‍රණය කිරීමේදී, මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා සමඟ කාර්යයේ නියුතු හවුල්කරු අනුකූල වී ඇති ආකාරය තීරණය කිරීම. අ118 ඡේදයේ විස්තර කර ඇති පරිදි විගණන කාර්යයෙහි ස්වභාවය සහ තත්ත්වයන් සහ විගණන ලේඛන මගින් විගණන කාර්යය පුරාවට කාර්යයේ නියුතු හවුල්කරුගේ සහභාගිත්වය සනාථ කරන ආකාරය අනුව කළ යුතු අදාළ සළකා බැලීම් ඇතුළත් වේ.

අ115. කාර්යයේ නියුතු හවුල්කරු ප්‍රමාණවත් ලෙස සහ උචිත ලෙස සම්බන්ධ වී නොමැති බවට දැක්වෙන දර්ශක වලට ඇතුළත් වන උදාහරණ ලෙස:

- ප්‍රමාණාත්මක අව ප්‍රකාශයේ අවදානම් තක්සේරු කිරීම සහ එම අවදානම් සඳහා ප්‍රතිචාර සැලසුම් කිරීම ඇතුළුව, විගණන කාර්යය සැලසුම් කිරීමේ හවුල්කරු විසින් කාලෝචිත සමාලෝචනයක් සිදු කර නොමැතිකම.
- කාර්යය, ක්‍රියා හෝ ක්‍රියාපටිපාටි පවරා ඇති අය ඔවුන්ගේ වගකීම් සහ අධිකාරියේ ස්වභාවය, පැවරෙන කාර්යයේ විෂය පථය සහ එහි අරමුණු පිළිබඳව ප්‍රමාණවත් ලෙසට දැනුවත් කර නොමැති බවට වූ සාක්ෂි සහ වෙනත් අවශ්‍ය උපදෙස් සහ අදාළ තොරතුරු ලබා දී නොමැති වීම.
- කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් හට වූ කාර්යයයේ නියුතු හවුල්කරුගේ මඟපෙන්වීම හා අධීක්ෂණය පිළිබඳ සහ ඔවුන්ගේ වැඩ සමාලෝචනය පිළිබඳ සාක්ෂි නොමැතිකම.

අ116. කාර්යයේ නිවයුතු හවුල්කරුගේ මැදිහත්වීම, සිදු කරන ලද සැළකිය යුතු විනිශ්චයන් හා එළැඹ ඇති නිගමන සුදුසු බව තීරණය කිරීමට පදනම සපයන්නේ නැතිනම්, 40 වන ඡේදය මගින් අවශ්‍ය කරන නිශ්චය කිරීමට එළැඹීමට කාර්යයේ නියුතු හවුල්කරුට නොහැකිවනු ඇත. එවැනි තත්ත්වයන් තුළ ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සමාගමේ ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි සැළකිල්ලට ගැනීමට අමතරව කාර්යයේ නියුතු හවුල්කරු විසින් ගත හැකි සුදුසු ක්‍රියාමාර්ගවලට ඇතුළත්, උදාහරණයක් ලෙස;

- විගණන සැලැස්ම යාවත්කාලීන කිරීම සහ වෙනස් කිරීම;
- සමාලෝචනයේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ සැලසුම් ගත ප්‍රවේශය නැවත ඇගයීම සහ කාර්යයේ නියුතු හවුල්කරුගේ මැදිහත්වීම වැඩි කිරීම සඳහා සැලසුම් කළ ප්‍රවේශය වෙනස් කිරීම; හෝ
- සමාගමේ තත්ත්ව කළමනාකරන පද්ධතියේ අදාළ අංශය සඳහා මෙහෙයුම් වගකීම පැවරී ඇති පුද්ගලයින් සමග උපදේශනය.

**ලේඛනගත කිරීම** (යොමුව: 41 ඡේදය)

අ117 ශ්‍රීලංවිප්‍ර 230[46] ට අනුව, විගණනය ශ්‍රීලංවිප්‍ර සමග අනුකූල වන බවට විගණන ලේඛන සාක්ෂි සපයයි. කෙසේ වුවද, විගණනයකදී සළකා බලනු ලබන සෑම කරුණක්ම හෝ සිදු කරන ලද වෘත්තීය විනිශ්චයක්ම ලේඛනගත කිරීම විගණකවරයාට අවශ්‍ය හෝ ප්‍රායෝගික නොවේ. තවද, විගණන ගොණුව තුළ ඇතුළත් ලේඛන මගින් අනුකූලතාව පෙන්නුම් කරන කරුණුවලට අනුකූල වීම (උදාහරණයක් ලෙස පිරික්සුම් ලැයිස්තුවක් මෙන්), විගණකවරයා විසින් වෙන වෙනම ලේඛනගත කිරීම අනවශ්‍ය වේ.

අ118. මෙම ශ්‍රීලංවිප්‍ර හි අවශ්‍යතා මඟින් 40 ඡේදයට අනුව කාර්යයේ නියුතු හවුල්කරුගේ මැදිහත්වීම සහ කාර්යයේ නියුතු හවුල්කරුගේ නිශ්චය කිරීම සකස් කිරීම ඇතුළුව. කාර්ය සාධනය ලේඛනගත කිරීම. විගණන කටයුතුවල ස්වභාවය සහ තත්ත්වයන් අනුව විවිධ ආකාරවලින් ඉටු කළ හැක. උදාහරණ වශයෙන්;

- විගණන සැලැස්ම ව්‍යාපෘති කළමනාකරණ ක්‍රියාකාරකම්වල අත්සන් කිරීම් හරහා කාර්යයේ නියුතු

[46] ශ්‍රීලංවිප්‍ර 230, අ7 ඡේදය

කණ්ඩායමේ මෙහෙයවීම ලේඛනගත කළ හැක;

- කාර්යයේ නියුතු කණ්ඩායමේ විධිමත් රැස්වීම්වල වාර්තා. කාර්යයේ නියුතු හවුල්කරුගේ සන්නිවේදනයේ පැහැදිලිකම. අනුකූලතාවය සහ එලදායිතාවය සහ සංස්කෘතිය සම්බන්ධයෙන් වූ අනෙකුත් ක්‍රියාවන් සහ ගුණාත්මකභාවය සඳහා සමාගමේ කැපවීම පෙන්නුම් කරන අපේක්ෂිත හැසිරීම් පිළිබඳ සාක්ෂි සැපයිය හැක.

- කාර්යයේ නියුතු හවුල්කරු සහ කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් අතර සහ අදාළ වන පරිදි කාර්යයෙහි ගුණාත්මක සමාලෝචකයා අතර වූ සාකච්ඡාවල න්‍යායපත්‍ර සහ කාර්යයේ නියුතු හවුල්කරු කාර්යය සඳහා ගත කළ කාලය පිළිබඳ අදාළ අත්සන් සහ වාර්තා මගින් විගණන කාර්යය පුරාවටම කාර්යයේ නියුතු හවුල්කරුගේ මැදිහත්වීම හා කාර්යයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් අධීක්ෂණය පිළිබඳ සාක්ෂි සැපයිය හැක; හෝ

- කාර්යයේ නියුතු හවුල්කරු සහ කාර්යයේ නියුතු අනෙකුත් සාමාජිකයින් විසින් අත්සන් කිරීමෙන් වැඩපත්‍රිකා සමාලෝචනය කළ බවට සාක්ෂි සපයයි.

අ119. විගණන කාර්යයේ ගුණාත්මකභාවය ළඟා කර ගැනීමේ අවදානමක් ඇතිවිය හැකි තත්ත්වයන් සමඟ කටයුතු කරන විට, වෘත්තිය සංශයභාවයේ ක්‍රියාවන් සහ විගණකගේ සළකා බැලීම් ලේඛන වැදගත් විය හැකිය. උදාහරණයක් වශයෙන්. කාර්යයේ නියුතු හවුල්කරු සමාගම කාර්යය ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ තොරතුරු ලබා ගන්නේ නම් (24 ඡේදය බලන්න). කාර්යයේ නියුතු කණ්ඩායම එම තත්ත්වය සමඟ කටයුතු කළ ආකාරය පිළිබඳ පැහැදිලි කිරීම් ලේඛනගත කිරීම ඇතුළත් විය හැකිය.

අ120 දුෂ්කර හෝ විවාදාත්මක කරුණු සම්බන්ධව වෙනත් වෘත්තිකයින් සමඟ වූ උපදේශන ලේඛනගත කිරීමෙන් ප්‍රමාණවත් තරම් සම්පූර්ණව සහ සවිස්තරාත්මකව අවබෝධ කරගැනීමට පහත පරිදි දායක වේ.

- උපදේශනය ඉල්ලා සිටි ගැටළුවේ ස්වභාවය සහ විෂය පථය; සහ

- ගනු ලැබූ ඕනෑම තීරණයක් ඇතුළුව උපදේශනයේ ප්‍රතිඵල, එම තීරණ සඳහා පදනම සහ ඒවා ක්‍රියාත්මක කළ ආකාරය.

EOG 04 - 0127

ශ්‍රී ලංකා රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කර ඇත.